# ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය



කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

# අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය
## ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය

ළමුන් සඳහා යහපත් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා අප රජයක් ලෙසට බැඳී සිටින අතර මෙම යහපත් පරිසරය යන්න ළමුන් සඳහා අධ්‍යාපනය, සෞඛ්‍ය, රැකවරණය මෙන්ම තම ස්වභාවික පවුලේ ජීවත්වෙමින් ආදරය උණුසුම ලැබීමට ඇති අයිතියද තහවුරු වූවක් විය යුතු වේ. යම් දරුවෙකුට තම ස්වභාවික පවුලේ රැකවරණය අහිමි වේ නම් එකී දරුවන්ට තම විස්තෘත පවුලේ සාමාජිකයින් සමඟ ජීවත්වීමට හෝ වෙනත් විකල්ප පවුලක රැකවරණය ලැබීමට අයිතියක් තිබිය යුතුවේ. ශ්‍රී ලාංකික ළමයින් සඳහා වූ විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය මගින් එසේ රැකවරණය අහිමි වූ ළමුන් සඳහා විධිමත් වූ රැකවරණ ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති අතර ඉන් දෙමාපිය, භාරකරුවන්ගේ රැකවරණය අහිමි වූ ළමුන් වෙනුවෙන් සුරක්ෂිත පවුල් පසුබිමක් සකස් කෙරෙනු ඇත. එසේම පවුලේ රැකවරණය අහිමිවීමට අවදානමක් ඇති ළමුන් හඳුනාගෙන විවිධ නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් අවදානම් සහගත ළමුන් සුරක්ෂිත කිරීමටද හැකියාව ලැබෙනු ඇත.

කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මෙම ප්‍රතිපත්තිය සකස් කළද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී හා මෙම ප්‍රතිපත්තියෙන් හඳුනාගත් ගැටළු ආමන්ත්‍රණය කිරීමේදී විවිධ රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන වලටද ඒ සඳහා විශාල කාර්යභාරයක් සිදු කිරීමට ඇත.

මධ්‍යම රජයේ හා පළාත් මට්ටමින් ඇති ආයතනවල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මෙම ප්‍රතිපත්තියේ සඳහන් "ප්‍රතිපත්ති ක්‍රමෝපායන්" තිරසර සංවර්ධන අරමුණු 16.2 හි සඳහන් සුවිශේෂි දර්ශනය කරා ළඟාවීම පෙරදැරි කරගෙන තම වැඩසටහන්වලට ඇතුළත් කර සාර්ථකව ක්‍රියාත්මක කරන ලෙසට අනෙකුත් රාජ්‍ය ආයතනවලින් මා ඉල්ලා සිටිමි.

දරුවන් සුරකිමු ජාතික වැඩසටහනේ අරමුණ වන්නේ ද දරුවන් ආරක්ෂා කර ගනිමින්, ඔවුන්ගේ ශාරීරික හා මානසික වර්ධනයට උපකාරී වන වඩාත් යහපත් හා සුවදායක පරිසරයක් ඔවුන්ට උදාකර දීම වේ. ඒ අනුව ළමුන් සඳහා වැඩසටහන් මාලාවක් දිවයින පුරා ක්‍රියාත්මක කර ඇති අතර මෙම ප්‍රතිපත්තියේ සඳහන් ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම මගින්ද වරප්‍රසාද අහිමි ළමුන් සඳහා වඩාත් යහපත් පරිසරයක් ඇති කිරීමට හැකි වෙතැයි මම විශ්වාස කරමි.

ළමුන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය එළිදැක්වීම කාලීන අවශ්‍යතාවයක් වන අතර ඒ සඳහා දායකත්වය දක්වන ලද සියළුම පාර්ශව වලට මාගේ ස්තූතිය පුද කරමි.

**මෛත්‍රීපාල සිරිසේන**
ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය

# ගරු අගමැතිතුමාගේ පණිවුඩය
## ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය

රටක අභිවෘද්ධිය සහ යහපැවැත්ම රඳාපවතින්නේ පුරවැසියන්ගේ පෞරුෂ සංවර්ධනය මතය. එබඳු පුරවැසි රාජ්‍යයක් වෙනුවෙන් අද දවසේ දරුවන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක්ව පවතී. කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරන ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය ඒ සඳහා ශක්තිමත් අත්වැලක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

මෙම ප්‍රතිපත්තිය මගින් පවුලේ රැකවරණය අහිමි වීම මත අවදානම් සහගත තත්ත්වයේ පසුවන ළමුන් හඳුනාගෙන ඔවුන්ට නිසි රැකවරණ ලබාදීමේ වැඩපිළිවෙලක් යෝජනා කරන අතරම, සිය පවුල් සංස්ථාවෙන් ගිලිහුණු දරුවන් සඳහා සුදුසු විකල්පයක් ඔවුන්ගේ උපරිම යහපත සැලසෙන පරිදි යෝජනා කර ඇත.

පවුල් සංස්ථාව විවිධ අභියෝගයන්ට, අර්බුදයන්ට මුහුණ දෙන විට, එයින් බරපතල ලෙස පීඩාවට පත්වන්නේ දරුවන්ය. එබැවින් ස්වභාවික පවුල හෝ ආදරය සහ රැකවරණයෙන් පිරිපුන් වෙනත් විකල්ප පවුලක හැදී වැඩීමට සෑම ළමයෙකුට ඉඩප්‍රස්ථාව සකසා දීමට රජයක් ලෙස අපි බැඳී සිටිමු. එවැනි දරුවන් උදෙසා ආයතනික රැකවරණය අවසාන විකල්පය විය යුතුය.

මෙම ජාතික ප්‍රතිපත්ති ක්‍රමෝපායන් නිවැරදිව අවබෝධ කරගෙන ආදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත්ය. වරප්‍රසාද අහිමි ළමුන් වෙනුවෙන් කටයුතු කරන මධ්‍යම රජයේ සහ පළාත් සභා සියලුම රාජ්‍ය ආයතනවලටත් ළමුනට විකල්ප රැකවරණ සැලසීමේදී ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව මෙම ජාතික ප්‍රතිපත්තියෙන් නිසි මඟපෙන්වීමක් කර ඇත.

ළමුන් සඳහා විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය දැයේ දරුවන්ට යහපත් අනාගතයක් උදාකරනු සඳහා ශක්තිමත් අත්වැලක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

**රනිල් වික්‍රමසිංහ**
අගමැති
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය

## ගරු අමාත්‍යතුමියගේ පණිවුඩය

## කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍ය

දරුවන් රටක වටිනාම සම්පතයි. දරුවන් යහපත් වැඩදායක පුරවැසියන් ලෙසට අනාගතයේදී රටට දායාද කිරීමට නම් ඒ සඳහා ඔවුන්ට හිතකර සුන්දර ළමා කාලයක් හිමි විය යුතුවේ.

ළමුන්ගේ ජීවත්වීමේ, සංවර්ධනය වීමේ, ආරක්ෂා වීමේ සහ සහභාගී වීමේ අයිතීන් තහවුරු කර දෙමින් සුරක්ෂිත ළමා කාලයක් ඔවුන්ට ලබා දුනහොත් පමණක් ඔවුන් වෙතින් අනාගතයේදී වැඩදායක පුරවැසියෙකු අපේක්ෂා කළ හැකිය. ශ්‍රී ලංකාවේ ළමුන්ගේ පවුල් පසුබිම පිළිබඳව සලකා බැලීමේදී සෑම ළමයෙකුටම පොදුවේ එක හා සමානව තම න්‍යෂ්ඨික පවුලේ රැකවරණය හා පෝෂණය ලැබීමට ඉඩ ප්‍රස්ථා නොලැබේ.

ගෝලීය වශයෙන් ගත් කළද විවිධ සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික සාධක මෙන්ම යුධ අරගල හේතුකොට ගෙන "පවුල් සංස්ථාව" සීඝ්‍රයෙන් වෙනස්වීමකට ලක් වෙමින් පවතී. පවුල් සංස්ථාවේ වෙනස්වීම ඇතැම් අවස්ථාවල ළමුන්ට අහිතකරව බලපාන බවට ලංකාවේ මෙන්ම ලෝක තත්ත්වය කෙරෙහිද අවධානය යොමු කිරීමේදී පැහැදිලි වේ. පවුල් සංස්ථාවේ වෙනස්වීම් හේතුවෙන් තම ස්වභාවික පවුලෙන් බැහැරව වෙනත් විකල්ප ක්‍රම ඔස්සේ රැකවරණය ලැබීමට ඇතැම් ළමුන්ට සිදුව ඇත.

ළමා රැකවරණය පිළිබඳව මෙවන් අභියෝග රාශියක් පවතින මොහොතක ළමුන් සඳහා විකල්ප රැකවරණ ප්‍රතිපත්තියක් සකස් කොට විධිමත් විකල්ප රැකවරණ අවස්ථා සැලසීමට පසුබිම සකස් කිරිමට උත්සහ කිරීම පිළිබඳව අතිශයින් සතුටු වෙමි.

එසේම මෙම ප්‍රතිපත්තියේ සඳහන් ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරිම, අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීමේ යාන්ත්‍රණයත් අමාත්‍යාංශයේ මැදිහත්වීම යටතේ ඇති කිරීමටද අපේක්ෂා කරමි. තවද ඒකාබද්ධ ප්‍රවේශයකින් අනෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගය මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා ඉතා වැදගත් වේ.

තවද මෙම ප්‍රතිපත්තිය සකස් කිරීම කාලීන අවශ්‍යතාවයක් ලෙසට සලකන අතර එය මෙරට රාජ්‍ය ආයතනවලට, රාජ්‍ය නොවන සංවිධාන මෙන්ම ළමුන් සමඟ වැඩ කරන පෞද්ගලික අංශයන්ටද විශාල මගපෙන්වීමක් ලබා දෙනු ඇතැයි විශ්වාස කරමි. මෙම මහගු කාර්යයට සම්බන්ධ වූ අමාත්‍යාංශ ලේකම්තුමියට, පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්තුමිය ඇතුළු එම දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයට මාගේ කෘතඥතාවය මේ අවස්ථාවේදී පුද කිරීමට කැමැත්තෙමි.

**චන්ද්‍රානි බණ්ඩාර**
කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍ය

# පෙරවදන

ළමුන් සඳහා විකල්ප රැකවරණ ප්‍රතිපත්ති සකස් කිරිමේදී ඒ සඳහා පාදක කර ගැනීමට උපදෙස් මාලාවක් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2010 වසරේදී නිකුත් කර ඇත. එසේම මෙරට ළමුන්ට විකල්ප රැකවරණය සැපයීමට විවිධ අණපනත් යටතේ ප්‍රතිපාදන සලසා ඇත.

වර්තමාන ශ්‍රී ලාංකික පසුබිම තුළ ළමුන් ආයතනගත කිරීම වෙනුවට විකල්ප රැකවරණය ලබාදීමේදී අනුගමනය කළ යුතු පැහැදිලි ක්‍රමවේදයක් නොමැතිවීම නිසා හා ළමා රැකවරණ ක්ෂේත්‍රයේ ඇති සංකීර්ණභාවය මෙන්ම සම්පත් හිඟකම යන හේතු නිසා තම පවුලේ රැකවරණය අහිමි වන ළමුන්ට නිසි වයසේදී විකල්ප පවුලක රැකවරණය ලැබීමට ඇති අවස්ථාද අහිමි වී ඇති බවට නිරීක්ෂණය වි ඇත.

ඒ හේතුවෙන් ඔවුන්ට සිය ළමා කාලය තුළ හිමිවිය යුතු බොහොමයක් අයිතිවාසිකම් අහිමිවී තිබේ. එබැවින් තම පවුලේ රැකවරණය අහිමි වන සෑම ළමයෙකුටම නිසි වයසේදී විධිමත් පරිදි විකල්ප රැකවරණය ලැබීමට අවශ්‍ය වටපිටාව සකසා දීම රජයේ වගකීම වේ.

මෙම ප්‍රතිපත්තිය තුළින් ක්‍රමෝපායන් 06ක් ඔස්සේ ප්‍රතිපත්ති මැදිහත්වීම් හඳුනාගෙන ඇත. තම ස්වභාවික පවුලෙන් ගිලිහීමට අවදානමක් ඇති ළමුන් හඳුනාගෙන වැළැක්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, විකල්ප රැකවරණයට පත්ව ඇති ළමුන්ට විධිමත් සේවාවක් ලබාදීම මෙන්ම ආයතනගත කිරීම අවසාන විකල්පය විය යුතු බව මෙහිදී හඳුනාගෙන ඇත. මෙම ප්‍රතිපත්තිය සඳහා 2019.03.06 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර ක්‍රියාකාරී සැලසුමකට අනුව විවිධ වැඩසටහන් ඔස්සේ මෙම ප්‍රතිපත්තිය සඳහා "ප්‍රතිපත්තිමය මැදිහත්වීම" ඉදිරියේදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේදී ඒ වෙනුවෙන් ඇපකැප වී කටයුතු කර මෙම ප්‍රතිපත්තිය සාර්ථකව එළි දැක්වීමට කටයුතු කළ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් පී. චන්ද්‍රිමා සිගේරා මහත්මියට හා එතුමියගේ කාර්යය මණ්ඩලයට මෙන්ම යුනිසෙෆ්, ෆ්‍රිඩ්ස්රෝ හා අනෙකුත් රාජ්‍ය නොවන ආයතනවලටද මාගේ අවංක ස්තුතිය මේ අවස්ථාවේදී පුද කිරීමට කැමැත්තෙමි.

**දර්ශනා සේනානායක**
ලේකම්
කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය

# ස්තූතිය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සමඟ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මුළුමනින්ම විමධ්‍යගත විෂයක් බවට පත්විය. ඒ අනුව පරිවාස හා ළමාරක්ෂක විෂය පථයට වැටෙන සේවා සැපයීමේ කාර්යභාරය පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් යටතේ ක්‍රියාත්මක වේ. එසේම එකී විමධ්‍යගත වූ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු විෂය මුල් කරගෙන පළාත් සභා අතර සම්බන්ධීකරණය ඇති කිරීම, ළමුන්ට අදාළ විෂය ක්ෂේත්‍රයේ නීතිරීති සංශෝධනය හා ප්‍රතිපත්ති සකස් කිරීම, පළාත් සභා සඳහා තාක්ෂණික සහාය ලබාදීම, නිලධාරීන් පුහුණු කිරීම හා යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය සහාය ලබාදීම වැනි කටයුතු මධ්‍යම රජයේ කාර්යය භාරය බවට පත්විය.

එලෙස පැවරුණු බලතල මත මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සකස් කිරීමේ මූලික කටයුතු අරඹන ලදී.

පසුගිය දශක දෙකක පමණ කාලයක් තුළ ආයතනගත වූ ළමුන්ගේ ප්‍රමාණය සංඛ්‍යාත්මකව ඉහළ ගොස් ඇති බව අදාළ සංඛ්‍යා ලේඛන වාර්තාවලින් පැහැදිලි වේ. ළමුන් ආයතනගත වීමට හේතු විමසා බැලීම සඳහා කරනු ලැබූ සමීක්ෂණ කිහිපයක් ඇති අතර එකී සමීක්ෂණවලින් තහවුරු වී ඇති ආකාරයට දූප්පත්කම, බිඳුණු පවුල්, සෞඛ්‍යමය හේතු හා වෙනත් සමාජ, ආර්ථික හේතු පදනම් කරගෙන ළමුන් ළමා නිවාස ගත වන බව පෙනී යයි.

එක් පසෙකින් දැනට මෙරට තුළ ඇති පවුල් නගා සිටුවීමේ වැඩසටහන් හා අනෙකුත් නිවාරණ වැඩසටහන්වල ප්‍රතිලාභ සෘජුවම මෙම අවදානම් සහගත ළමුන්ට හා ඔවුන්ගේ පවුල්වලට නොලැබෙන තත්ත්වයක් ඇත. අනෙක් පසින් ආයතන ගත වන ළමුන් සමාජගත කිරීමට අවශ්‍ය වන නෛතික රාමුව තුළ හා ක්‍රමවේදයන් තුළ ඇති අඩුපාඩු ළමුන් සමාජගත කිරිමට බාධාවක් වී ඇත. ආයතනගත ළමුන් මුල් කරගෙන ඔවුන් සමාජගත කිරීමට අවශ්‍ය සම්පත් හා පහසුකම් නිසි පරිදි හඳුනා නොගැනීම නිසාද ළමුන් සමාජගත කිරීමට බාධා ඇතිවී තිබේ.

මෙකී තත්ත්වයන් පිළිබඳව මූලික අවධානය යොමු කරමින් මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමට පියවර ගන්නා ලදී. මෙම ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමේදී පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩලයේ අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී. එයට අමතරව මෙම විෂය සම්බන්ධයෙන් දරුවන් සමඟ සෘජුව කටයුතු කරනු ලබන අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල මෙන්ම ළමුන්ගේ හා ඔවුන්ගේ දෙමාපියන්ගේද සෘජු සහභාගීත්වය හා අදහස් හා යෝජනා ලබාගෙන මෙම ප්‍රතිපත්තිය කෙටුම්පත් කරන ලදී. ඒ සඳහා පළාත් මට්ටමින් සාකච්ඡා වට ගණනාවක් පවත්වන ලදී. අවසානයේදී ජාතික මට්ටමින් අදහස් හා යෝජනා ලබා ගැනීම සිදු කරන ලදී.

එසේ ලබා ගන්නා අදහස් හා යෝජනාවලට අනුව කෙටුම්පත නැවත සංස්කරණය කරන ලදී. අවසානයේදී පාර්ලිමේන්තු කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කමිටුව මගින් මෙම කෙටුම්පත වලංගුභාවයට පත් කරන ලදී. අනතුරුව අමාත්‍ය මණ්ඩලය මගින් 2019.03.06 දින මෙම ප්‍රතිපත්තිය සඳහා අනුමැතිය ලබා දෙන ලදී. ඉදිරියේදී මෙම ප්‍රතිපත්තිය මුල් කරගෙන ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට එය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

වරප්‍රසාද අහිමි ළමුන්ගේ භාරය හා ආරක්ෂාව තහවුරු කරමින් ඔවුන්ට සුරක්ෂිත පවුල් පසුබිමක් සකස් කිරීමට උපකාර වන මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමට දායක වූ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු නිලධාරීන්ට, අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන නිලධාරීන්ට, මෙම ප්‍රතිපත්තියට අදහස් හා යෝජනා ඉදිරිපත් කළ ළමාරක්ෂක ක්ෂේත්‍රයේ තාක්ෂණික දැනුම ඇති විශේෂඥයින්ට මාගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුද කිරීමට කැමැත්තෙමි.

තවද යුනිසෙෆ් ශ්‍රී ලංකා, ෆ්‍රිඩ්ස්රෝ ආයතනවල තාක්ෂණික හා මූල්‍යමය දායකත්වයට මාගේ ස්තුතිය පුද කරමි. තවද මෙම ප්‍රතිපත්තියට සිය යෝජනා හා අදහස් ලබාදෙමින් ප්‍රතිපත්තිය සකස් කිරීමට දායකත්වය ලබාදුන් මහාචාර්ය සාවිත්‍රි ගුණසේකර මහත්මියට, ආචාර්ය හරිනි අමරසූරිය මහත්මියට, ආචාර්ය චාරිකා මාරසිංහ මහත්මියට, ආචාර්ය හිරන්ති විජේමාන්න මහත්මියටද මාගේ විශේෂ ස්තුතිය පුද කරමි.

එසේම මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමේදී සියළු සම්බන්ධීකරණ කටයුතු සිදු කළ ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරිනි නිර්මලී පෙරේරා මහත්මියට හා මාගේ කාර්යය මණ්ඩලයට මාගේ විශේෂ ස්තුතිය පුද කරමි.

එසේම කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමියට මෙම ප්‍රතිපත්තිය සකස් කිරීමට දක්වන ලද සහායටද ස්තුතිය පුද කරමි.

**පී. චන්දිමා සිගේරා**
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

# පටුන


පූර්විකාව xi

1 වන කොටස

හැඳින්වීම 1
1.1 විකල්ප රැකවරණ ප්‍රතිපත්තියෙහි විෂයපථය 2
1.2 විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සකස් කිරීමේ ක්‍රියාවලිය 3

2 වන කොටස

විකල්ප රැකවරණ ප්‍රතිපත්තියට පදනම් වූ හරයන් සහ මූලධර්ම 4
2.1 අවශ්‍යතා මූලධර්මය 4
2.2 යෝග්‍යතා මූලධර්මය 4
2.3 හරයන් හා මූලධර්ම 4 - 5

3 වන කොටස

දැක්ම හා ඉලක්ක 6
3.1 දැක්ම 6
3.2 ඉලක්ක 6

4 වන කොටස

විකල්ප රැකවරණය අවශ්‍ය වන දරුවන් ගේ තත්ත්වය 7 - 9

5 වන කොටස

විවිධ විකල්ප රැකවරණ ක්‍රම 11
5.1 විකල්ප රැකවරණය අර්ථ දැක්වීම 11
5.2 විධිමත් විකල්ප රැකවරණයන් හා පවුල් ආශ්‍රිත සහයයන් 11
5.3 පවුල් පාදක රැකවරණ 11
5.4 පවුලක් වැනි රැකවරණ 12
5.5 අනෙකුත් සේවාවන් සහ යාන්ත්‍රණයන් 12 - 13

6 වන කොටස

උපායමාර්ගයන් හා ප්‍රතිපත්ති මැදිහත්කරණයන් 14
6.1 ආයතනගතවීම වැලැක්වීම 14
6.2 ද්වාර පාලනය 15
6.3 විකල්ප රැකවරණ පද්ධතිය තුල සිටින දරුවන් 15 - 17
6.4 නිතිය සමග සම්බන්ධ වූ දරුවන් හා නීතිය සමග ගැටුම් ඇති කරගත් දරුවන් 17 - 19
6.5 දරුවන් පවුල් සංස්ථාව සමග යලි එක් කිරීම හා සමාජගත කිරීම 19 - 20
6.6 නීති ප්‍රතිසංස්කරණයන්, ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් සහ අවම ප්‍රමිතීන් 20 - 21

7 වන කොටස

ආයතනික රාමුව, අධීක්ෂණ හා සමාලෝචනය ක්‍රමවේදය 23

පාරිභාෂික වචන 24

ඇමුණුම්
ඇමුණුම් - 1 25 - 26
ඇමුණුම් - 2 26 - 28
ඇමුණුම් - 3 28 - 29

# පූර්විකාව

ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා වන විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය මගින් දරුවන් සඳහා සාධනීය වූ විකල්ප රැකවරණ විසඳුම් ගණනාවක් ඉදිරිපත් කරන අතර ම, ආරක්ෂාව හා රැකවරණය අහිමි වූ හෝ එසේ අහිමි වීමේ අවදානමක් සහිත දරුවන්හට  නිවසේ දී හෝ නිවසින් පිටත දී රැකවරණය ලබා දීමේ සේවා සපයන සියලු විධිමත් ව්‍යූහයන් ප්‍රතිව්‍යූහගත කිරීම ද දිරිගන්වනු ලබයි. මෙම විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය මගින් බාලක යුක්තිය පසඳලීමේ ක්‍රමවේදය යටතේ සිටින්නා වූ දරුවන් ද ආමන්ත්‍රණය කෙරේ. එමෙන්ම, පවුල් සංස්ථාවෙන් වෙන් වීමේ අවදානමක් ඇති දරුවන්හට මෙන් ම ළමා අපචාර, නොසලකා හැරීම, ළමා ශ්‍රමිකත්වය, දරිද්‍රතාවය, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය, සිරගත වීම, මිනිස් ජාවාරම, ශාරීරික සහ මානසික ආබාධ, ඒඩ්ස් රෝගයට ගොදුරු වීම, ගෘහස්ථ හිංසනය, අනාථබව, අත්හැර යාම සහ අවතැන් වීම වැනි විවිධ අහිමිවීම්වලට මුහුණ පා සිටින දරුවන් වෙනුවෙන් වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුම් ද මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ගෙන හැර දක්වයි. වීදිගතව ජීවත්වීමට හෝ සේවය කිරීමට බලහත්කාරයෙන් යොදවා ඇති  දරුවන් ද මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය මගින් සැලකිල්ලට ගනු ලබන අතර ඔවුන් සම්බන්ධ විධිවිධාන ද ඉදිරිපත්  කරනු ලබයි.

මෙම ලේඛනයෙහි විකල්ප රැකවරණය අර්ථ දක්වා ඇත්තේ දරුවකු හට ඔහු හෝ ඇය ගේ මාපිය සෙවනින් පිටත දී සපයන ඕනෑම රැකවරණයක් වශයෙන් වන අතර එය තවදුරටත්, ඥාති රැකවරණය, පෝෂක රැකවරණය හෝ කුලවද්දා ගැනීම අයත්  වන්නා වූ "පවුල් පාදක රැකවරණ" වශයෙන් සහ ආරක්ෂිත නිවාස, හදිසි අවස්ථා රැඳවුම් පියසි, විවේක සත්කාර, කණ්ඩායම් නිවාස හා ස්වේච්ඡා නිවාස වැනි පවුල් පරිසරයට සමාන නේවාසික රැකවරණයන් අයත් වන "පවුලක් වැනි රැකවරණ" වශයෙන් වර්ග කෙරේ. ශ්‍රී ලංකාවෙහි, "පවුලක් වැනි රැකවරණ" සපයන රැකවරණ මධ්‍යස්ථානයන් කිහිපයක් ඇති මුත්, අවශ්‍ය විටක දරුවකු තාවකාලික ව නවතා තැබීම සඳහා බොහොමයක් මධ්‍යස්ථානයන් දරුවන් ගේ යහපැවැත්මට හිතකර හා යෝග්‍ය ස්ථාන බවට පත් කිරීමටත් පවුලක් තුල වූ තත්ත්වයන් ඇති කිරීමටත් ප්‍රතිව්‍යූහගත කිරීම අවශ්‍ය වේ. එය සිත්හී රඳවා ගනිමින්, දරුවන් රඳවා ගන්නා කාල සීමා දැඩි ව නිශ්චිත කිරීම තුලින් දරුවන් තම පවුල සමඟ යළි එක් කිරීම හෝ පවුල් පාදක රැකවරණයක් වෙත මාරු කිරීම අපේක්ෂා කරන අතර ම, පවතින රැකවරණ මධ්‍යස්ථානයන්හී දරුවන් සංඛ්‍යාව අඩු කිරීම හා ළමා මිතුරු පරිසරයක් ඇති කිරීම ඔස්සේ විකල්ප රැකවරණ සපයන ආයතන ප්‍රතිව්‍යූහගත කර ක්‍රමානුකූල ආයතනහරණයකට මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සහය වෙයි.

මෙම විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය පහත දැක්වෙන ප්‍රතිපත්ති ප්‍රකාශන හයෙන් සහ ඒ එක එකක් සඳහා වූ සාධනීය ප්‍රතිපත්ති මගපෙන්වීම්වලින් සමන්විත වෙයි.

1. ආයතනගත වීම වැලැක්වීම
2. ද්වාර පාලනය
3. විකල්ප රැකවරණ පද්ධතිය තුල සිටින දරුවන්
4. නිතිය සමග සම්බන්ධිත දරුවන් හා නීතිය සමග ගැටුම් ඇති කරගත් දරුවන්
5. දරුවන් පවුල් සංස්ථාව සමග යලි එක් කිරීම හා සමාජගත කිරීම
6. නීති ප්‍රතිසංස්කරණයන්, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ අවම ප්‍රමිතීන්

ශ්‍රී ලංකාවෙහි ආර්ථික, සාමාජීය හා සංස්කෘතික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් පවුල් පරිසරය අහිමි වූ හෝ අහිමි වීමේ අවදානමක් සහිත දරුවන් වෙනුවෙන් කටයුතු සලසන්නා වූ රජය, සේවා සපයන රාජ්‍ය ආයතන, හවුල්කරුවන්, පුද්ගලික අංශයේ සේවා සපයන්නන් සහ අනෙකුත් සියලු ම පාර්ශවකරුවන්හට, තම වගකීම් ක්‍රියාවට නැංවීම සඳහා සඳහා මගපෙන්වීම ලබා දීම මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තියෙහි අරමුණ වෙයි.



# හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වූකලී පවුල් සාරධර්ම සහ ආගමික සම්ප්‍රදායන් තදින් මුල් බැසගත් දිවයිනකි. ඉන්දියාවට දකුණු දෙසින් පිහිටා ඇති මෙම දිවයිනෙහි 2012 වසර වන විට ජනගහනය 20,359,439 වූ අතර ඉන් 74.9%ක් සිංහල ජාතිකයින් ද, 11.2% ක් ලාංකික දමිළ ජාතිකයින් ද, 9.3% ක් මුස්ලිම් ජාතිකයින් ද, 4.1% ක් ඉන්දීය දමිළ ජාතිකයින් ද 0.5% ක් වෙනත් ජාතිකයින් ද වූහ. නියෝජනය කෙරෙන ප්‍රධාන ආගම් වන්නේ බුද්ධාගම (70.1%), හින්දු ආගම (12.6%), ඉස්ලාම් ආගම (9.7%) සහ ක්‍රිස්තියානි ආගමයි (7.6%)[1]. 2012 වසරේ දී එහි ළමා ජනගහනය 6,060,000 විය[2].

වසර 2,500 ක් ඔබ්බට දිවෙන ඉතිහාසය පුරා පවුල් සංස්ථාව මත බැඳුණු සාරධර්ම සහ පරිචයන් සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයින් කීර්තියක් උසුලයි. සම්ප්‍රදායිකව, ශ්‍රී ලංකාවේ දරුවන් ඇති දැඩි කිරීම තනිව සිදුකල කාර්තව්‍යයක් නොවූ අතර ගැබිනි මවට සහය වීම මෙන් ම අලුත උපන් බිලිඳා ඇති දැඩි කර ගැනීම පවුලේ සාමාජිකයින්, හිතමිතුරන් හා අසල්වැසියන් යන පිරිස් එකතු වී සිදු කල ප්‍රජා කටයුත්තක් විය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ පවතින මෙම සමාජ සහය ලබා දීම වර්තමානයේ පවතින ආර්ථික සහ සාමාජයික වෙනස් වීම් හමුවේ හීන වෙමින් පවතිනු දක්නට ලැබෙන අතර එය දරුවන් ඇති දැඩි කර ගැනීමේ කර්තව්‍යය සඳහා සමාජය මත තැබූ විශ්වාසය ක්‍රමයෙන් අඩු වී යාමට හේතු වෙයි. එමෙන්ම, නාගරිකකරණය, දරිද්‍රතාවය, යුද්ධයේ බලපෑම, සමාජ ගතිකයන් වෙනස් වීම වැනි කරුණු රාශියක් හේතු කොට ගෙන සාම්ප්‍රදායිකව අප අතර තිබූ සමාජ හැඟීම කැඩී බිඳී ගොස් ඇති අතර දරුවන් රැක බලා ගැනීම පැවරීම සඳහා, තමාගේ ම අසල්වැසියන් නොහඳුන තත්ත්වයක් උදා වී ඇත.

දරුවන් තම නිවසෙහි සුපුරුදු වටපිටාව තුල ඇති දැඩි කිරීමේ වැදගත්කම බොහෝ ශ්‍රී ලාංකිකයින් අගය කල ද, තම නිවසින් දරුවන් ඈත් කර තැබීමට සිදු වන්නා වූ කරුණු ගණනාවක් වෙයි. මෑතකාලීන දත්තයන්ට අනුව, ආයතනගත දරුවන් ගෙන් 31% කගේ මාපියන් දෙදෙනාම ද 50% ක ගේ මාපියන් දෙදෙනා ගෙන් එක් අයෙක් ද ජීවත් ව සිටින අතර දෙමාපියන් දෙදෙනාම අහිමි අනාථ දරුවන් සිටිනුයේ 18% ක් පමණි. බොහොමයක් දරුවන් රැකවරණ ආයතනයන්ට ඇතුල් කිරීම ආර්ථික දුෂ්කරතා, අධ්‍යාපනය ලබා දීමට නොහැකි වීම, ආබාධ තත්ත්යවන්, ගෘහස්ථ ප්‍රචන්ඩත්වය, ශාරීරික හෝ මානසික රෝගී තත්ත්වයන්, දෙවන වරට විවාහවීම සහ රැකියා සඳහා විදේශගත වීම වැනි හේතු කරන කොට ගෙන සිදු වේ. දත්තයන්ට අනුව, ආරක්ෂාව හා රැකවරණය ලබා දීමේ අවශ්‍යතාවය හෝ විශෝධන සේවා සැපයීමේ අවශ්‍යතාවය උසාවි නියෝග හරහා නිර්දේශ කිරීම මත ආයතනයනගත කර ඇත්තේ ආයතනගත කළ දරුවන් ගෙන් 15% ක් පමණකි[3]. ආයතනගත කල දරුවන්ට අමතරව අවදානම් සහගත තත්ත්වයේ පසුවන වාර්තා නො වූ දරුවන් ද වෙති. උදා. වීදි දරුවන්

පරිපූර්ණ විකල්ප රැකවරණ සේවාවන්හී හිඟකම හේතුවෙන් බොහොමයක් දරුවන් දීර්ඝ කාලයක් රඳවා තැබීම සඳහා විශාල රැකවරණ මධ්‍යස්ථානයන්ට ඇතුලත් කර ඇත. ගෝලීය හා ජාතික සාක්ෂි පෙන්වා දෙනු ලබන්නේ එක් එක් දරුවා වෙත වෙන වෙන ම අවධානය නොමැති විට හා රැකවරණ සලසන්නෙකුගේ අඛණ්ඩ විශ්වාසනීය සම්බන්ධතාවයක් නොමැති විට, දරුවන් සමාජ විරෝධී හැසිරීම් පෙන්වීම හා සබඳතා ගොඩ නගා ගැනීමේ ගැටලු වැනි අභියෝග රැසක් සමග වර්ධනය වීමට බොහෝ සෙයින් ඉඩකඩ ඇති බවයි. පවුල් පාදක රැකවරණයන් මගින් දරුවකුහට ශාරීරික, චිත්තවේග හා සාමාජීය සහය සැලසීම සමග ම ඔහුගේ/ඇයගේ පූර්ණ විභවය දක්වා වර්ධනය වීම සඳහා අවශ්‍ය "තමා ද පවුලේ කොටසක්ය" යන හැඟීම ද ඇති කරවයි.

අවදානම් සහගත දරුවන් වෙනුවෙන් වූ නීති, ප්‍රතිපත්ති සහ පරිපාලන රෙගුලාසි ශ්‍රී ලංකාවේ වෙත්. දරුවන් ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමත්, දරුවන් ගේ ආරක්ෂාව ප්‍රධාන ප්‍රතිපත්ති මගපෙන්වීමක් කිරීමත් රජය භාර ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව මගින් ද දරුවන් ගේ සුභසාධනය හා යහපැවැත්ම වෙනුවෙන් විධිවිධාන සලසා තිබේ. තවද, එක්සත් ජාතීන් ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය, ආබාධ සහිත පුද්ගලයින් ගේ අයිතිවාසිකම් පිලිබඳ ප්‍රඥප්තිය වැනි ජාත්‍යන්තර ගිවිසුම් ගණනාවක පාර්ශව රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර බැඳීම්වලට ද එළඹ ඇත. මෙම සන්ධර්භය තුල, අවදානම් සහගත දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, නීති, රෙගුලාසි සහ සේවා රාමුවල පවතින හිදැස් ආමන්ත්‍රණය කිරීමටත්, එක්සත් ජාතීන් ගේ විකල්ප රැකවරණය පිලිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූල ව රජය විසින් මෙම විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය සකස් කරන ලදි.

මෙම ප්‍රතිපත්ති ලේඛනය, දරුවන් ආයතනගත වීම වැලැක්වීම සඳහාත්, ආයතනගත ව රැකවරණය ලබන දරුවන් තම පවුල සහ සමාජය සමඟ යලි එක් කිරීම සඳහාත් ප්‍රධාන ප්‍රතිපත්ති මගපෙන්වීම් ඉදිරිපත් කරනු ලබයි. එමෙන් ම දරුවන් අනවශ්‍ය ලෙස පවුලෙන් වෙන්වීම වලකාලමින්, දරුවන් ආයතනගත කිරීමේ අවදානම් තත්ත්වයක් ඇති පවුල් ශක්තිමත් කිරීමේ මූලික ප්‍රතිපත්ති මගපෙන්වීම් ද මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ගෙන හැර දක්වයි: දරුවන් ආයතනගත කිරීම සලකනු ලබන්නේ අවසාන විකල්පයක් වශයෙනි. ආයතනගත ව සිටින දරුවන් ගේ පවුල් අවදානම් සහගත තත්ත්වයෙන් මිදී ඇති බව සනාථ වූ පසු, දරුවන් යලි පවුල සමග එක් කිරීම පිලිබඳව ද, ප්‍රතිපත්ති මගපෙන්වීම් අවධාරණය කරනු ලබයි. එමෙන්ම, දරුවන් හා දෙමාපියන්/ භාරකරුවන් අතර ඇති භාවාත්මක බැඳීම නොබිඳී තබා ගැනීම සඳහා අවදානම් තත්ත්වයෙන් මිදී නොමැති පවුල් නැවත වරක් ඇගයීමට ලක් කෙරේ. ගෞරවානන්විත ව ජීවිත් වීමට තම පවුල් පරිසරය නුසුදුසු දරුවන්හට සලසනු ලබන විකල්පයන්ට, දැඩි ඇගයීමක් සිදු කොට සලසන ඥාති රැකවරණය අයත්වේ. වයස අවුරුදු 18 සම්පූර්ණ වූ හා වයස අවුරුදු 18 සම්පූර්ණ වීමට පෙර තම පවුල සමඟ එක් කෙරෙන දරුවන්හට ජීවත් වීමට, එම පරිසරය සූදානම් කිරීමේ ප්‍රතිපත්ති මගපෙන්වීම් ද මෙමගින් ලබාදී ඇත.

## 1.1 විකල්ප රැකවරණ ප්‍රතිපත්තියෙහි විෂයපථය

කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර සකස් කරන ලද මෙම ජාතික ප්‍රතිපත්තිය, සමස්ථ ආයතනහරණ ක්‍රියාවලියක් ඉලක්ක කොට ගත් රාමුවක් තුල හිඳිමින් විකල්ප රැකවරණ පද්ධතිය ශක්තිමත් කිරීමේ වැඩසටහන් සහ ආයතනික සැකසුම් හඳුනාගනු ලබයි. ඒ අනුව, මෙම උපායමාර්ගයන්හී අවසාන ඉලක්කය වන්නේ දරුවන් ආයතනගත වීම වැලැක්වීමත්, විශේෂ අවස්ථාවන්හි දී හැරුනු විට දරුවන් දිගු කල් ආයතනගත කර තැබීම ක්‍රමක්‍රමයෙන් අවසන් කිරීමත්ය. එක්සත් ජාතීන් ගේ ළමා අයිතිවාසිකම් පිලිබඳ සම්මුතියෙහි මූලධර්මයන් පිලිපදිමින්, දරුවන් ගේ ඉහළ ම භාරකරු රජය බවත්, සියලු ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් ඔවුන් ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා මග පෙන්වීම, මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය මගින් ලබා ගන්නා බවට තහවුරු කර ගැනීමේ වගකීම දරන බවත්, මෙම ප්‍රතිපත්තිය පිලිගනු ලබයි. මෙම විධිවිධාන භාවිතයේ යෙදවීමේදී දරුවා ගේ උපරිම යහපත මූලික ම වේ.

එබැවින්, පවතින නේවාසික රැකවරණයන් තුළ ළමා මිතුරුවූත්, පවුලක වැනිවූත් පරිසරයක් ඇති කරන ලෙසටත්, නව මධ්‍යස්ථාන ඉදි කිරීමේ දී ප්‍රමාණයෙන් විශාල මධ්‍යස්ථාන අවම කර ප්‍රමාණයෙන් කුඩා සහ චිකිත්සක ප්‍රතිකර්ම ලබා දෙන රැකවරණ මධ්‍යස්ථාන සඳහා වැඩි වශයෙන් ආයෝජනය කරන ලෙසටත් මෙම ප්‍රතිපත්තිය ඉල්ලා සිටියි. එමෙන්ම, දරුවන් දීර්ඝ කාලයක් ආයතනගතව තැබීම අවම කිරීම සඳහා, දරුවන් පිලිබඳ සමාලෝචනයන් සිදු කර ඔවුන් යළි පවුල සමඟ එක් කිරීමට හෝ දරුවාට උපරිම ව ඵලදායී විය හැකි අයුරින් වෙනත් නේවාසික රැකවරණයක් වෙත මාරු කර යැවීමට, සිද්ධි සම්මන්ත්‍රණ යාන්ත්‍රණය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මෙම ප්‍රතිපත්තිය අවධාරණය කර සිටියි.

දරුවන්හට තම පවුල සමග කෙටි හෝ දිගු කලක් ජීවත් වීම නොහැකි කරවන පවුල තුල පවතින ඇතැම් අවදානම් සහගත තත්ත්වයන්, (උදා. දෙමාපියන් සිරගත ව සිටීම, විදෘත පවුලක් නොමැති වීම), දරුවන් හට ගුණාත්මක රැකවරණයක් සැලසීමේ හැකියාව දෙමාපියන්ට අහිමි කරන අතර එවැනි දරුවන් ඉලක්ක කර ගනිමින්, පවුලක් වැනි රැකවරණයන් අප රටට අවශ්‍ය වේ. කුඩා ප්‍රමාණයේ ආරක්ෂිත නිවාස, වීදිගත දරුවන් සඳහා තාවකාලික හදිසි අවශ්‍යතා රැඳවුම් පියැසි, පවුලක විලාසය ගත් උපදේශන මධ්‍යස්ථාන සැම පලාතක ම තිබීම සුදුසු වේ. දරුවා ගේ උපරිම යහපත සැලකිල්ලට ගනිමින් සිදු කෙරෙන ආයතනහරණ ක්‍රියාවලියේ පරමාර්ථය විය යුත්තේ එබඳු පහසුකම් සපයන ස්ථාන ඇගයීමට ලක් කර ඒ එක එකෙහි අවශ්‍යතාවය ප්‍රමුඛතාගත කිරීමත්, දෙමාපිය සෙවනින් බැහැරව රැකවරණය අවශ්‍ය වන දරුවන් සඳහා පවුලක වැනි රැකවරණයක් ලබා නොදෙන්නා වූ ස්ථාන වසා දැමීමත්, දරුවන් සංඛ්‍යාව අඩු කිරීමට හෝ ප්‍රතිව්‍යුහගත කිරීමට පියවර ගැනීමත්ය. ඇමුණුම 1හි ශ්‍රී ලංකාවේ දැනට පවතින නේවාසික රැකවරණයන් පිලිබඳ විස්තර අන්තර්ගත වේ.

එමනිසා මෙම විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය, පවුල් පාදක රැකවරණයන් හා පවුලක් වැනි රැකවරණයන් පුළුල් කිරීම සඳහා විධිවිධාන මෙන් ම සැම නේවාසික රැකවරණයක් ම ළමා මිතුරුවූත් පවුල් පරිසරය බඳු වූත් ස්ථාන බවට පත් කිරීමත් අරමුණු කර ගනිමින් එම ස්ථානයන් ඇගයීමට ලක් කිරීමේ විධිවිධාන ද ගෙන හැර දක්වයි. මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය තහවුරු කෙරෙන අයුරින් සකස් කල ක්‍රියාකාරී සැලැස්මක් තුලින් ශක්තිමත් කරනු ලබන ශ්‍රී ලංකාවේ විකල්ප රැකවරණ සැලසීමේ ක්‍රමවේදය සාධනීය එකක් වනු ඇත. මෙම ප්‍රතිපත්ති ලේඛනය මගින් විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ, අධීක්ෂණය කිරීමේ හා විමර්ශණය කිරීමේ යාන්ත්‍රණයක් ද හඳුනාගනු ලබයි.

[1] ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (2012), 128 පිටුව

http://www.statistics.gov.lk/PopHouSat/CPH2011/Pages/Activities/Reports/FinalReport/FinalReport.pdf
ප්‍රවේශ වීම 2017 සැප්තැම්බර් 08 වැනිදා.

[2] ඉහත මූලාශ්‍රම

[3] ජාතික සමාජ සංවර්ධන ආයතනය (2013). ශ්‍රී ලංකාවේ විකල්ප ළමා රැකවරණ ආයතනයන් හී සහ ආයතනගත දරුවන් ගේ තත්ත්වයඃ තත්ත්ව විශ්ලේශණය. පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව. පිටුව 35

## 1.2 විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සකස් කිරීමේ ක්‍රියාවලිය

2017 වසරේ දී පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් විකල්ප රැකවරණය අවශ්‍ය දරුවන් ගේ තත්ත්වය සොයා බැලීම සඳහා කණ්ඩායම් දෙකක් (ක්ෂේත්‍ර පර්යේෂණ කණ්ඩායම සහ ප්‍රතිපත්ති සමාලෝචන කණ්ඩායම) පත් කරන ලදි. ක්ෂේත්‍ර පර්යේෂණ කණ්ඩායම විසින් විවිධ පාර්ශවකරුවන්, නේවාසික රැකවරණය ලබන දරුවන්, නේවාසික රැකවරණය ලබන දරුවන්ගේ දෙමාපියන්, ජාතික සහ පලාත් මට්ටමේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන නේවාසික රැකවරණයන් හී කාර්ය මණ්ඩල සහ ළමා සමාජ දරුවන් පිලිවිසීම සිදු කරන ලදි. ප්‍රතිපත්ති සමාලෝචන කණ්ඩායම විසින් පවතින නීති සහ පරිචයන්, නේවාසික රැකවරණ ක්‍රම හා විකල්ප රැකවරණ ක්‍රම පිලිබඳ සිදු කර ඇති අධ්‍යයනයන්, අදාල ප්‍රතිපත්ති හා සංඛ්‍යාලේඛනයන් අධ්‍යයනය කිරීම සිදුකරන ලදි. එමෙන්ම පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව එයට අදාල පාර්ශවකරුවන් සමග විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සඳහා අදහස් ලබා ගැනීමේ අරමුණින් වැඩමුලුවක් සංවිධානය කරන ලදි. ඉන් අනතුරුව, පර්යේෂණ කණ්ඩායම් දෙක විසින් මෙම වැඩමුලුවෙන් එක් රැස් කර ගත් තොරතුරු ද ඔවුන් ගේ පර්යේෂණ සොයා ගැනීම් ද පාදක කර ගනිමින් විකල්ප රැකවරණ ප්‍රතිපත්ති කෙටුම්පත සකසන ලදි. ඉන්පසු ජාතික උපදේශක වැඩමුලුවක් පවත්වමින් මෙම ප්‍රතිපත්ති කෙටුම්පත පාර්ශවකරුවන් වෙත ලබා දීම සිදු කෙරිණි. එම උපදේශක වැඩමුලුවෙහි අදහස් උපයෝගී කර ගනිමින් ප්‍රතිපත්ති කෙටුම්පත කවදුරටත් සංශෝධනය කෙරිණි. පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ළමා රක්ෂක ක්ෂේත්‍රයෙහි ප්‍රවීනයකු ගේ සහය ඇතිව මෙම සංශෝධනය කල ප්‍රතිපත්ති කෙටුම්පත අවසාන වශයෙන් සමාලෝචනය කර කරන ලදි. ඉන් අනතුරුව, මෙම අවසන් ප්‍රතිපත්ති ලේඛනය පාර්ලිමේන්තු කාන්තා සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිලිබඳ ආංශික අධීක්ෂක කාරක සභාවෙහි නිරීක්ෂණයන් සඳහා ඉදිරිපත් කර, තවදුරටත් සාකච්ඡාවට භාජනය කර අදහස් ලබාගැනීම සඳහා මහජනතාවට විවෘත කරන ලදි. අවසාන ප්‍රතිපත්ති ලේඛනය කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අනුමැතිය 2019 වසරේ මාර්තු මස 6 වැනි දින ලබා දෙන ලදි.

# විකල්ප රැකවරණ ප්‍රතිපත්තියට පදනම් වූ හරයන් සහ මූලධර්ම

මෙම ජාතික ප්‍රතිපත්තිය, විකල්ප ළමා රැකවරණය පිලිබඳ එක්සත් ජාතීන් ගේ මාර්ගෝපදේශයන් (එක්සත් ජාතීන් ගේ මහා සභාවෙහි A/RES/64/142 වන යෝජනාව) මත පදනම් වන අතර "අවශ්‍යතා මූලධර්මය" සහ "යෝග්‍යතා මූලධර්මය" සමග ඒකරේඛීය කර ඇත[4]. එමෙන් ම එය එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය, ශ්‍රී ලංකාවෙහි ව්‍යවස්ථාව, අප විසින් අපරානුමත කල අන්තර් ජාතික ගිවිසුම්වල ඇතුලත් අන්තර් ජාතික බැඳීම් හා මෙම ක්ෂේත්‍රයෙහි දැනුමෙන් යුත් ආයතනයන් ගෙන් ව්‍යුත්පන්න වූ යහපරිචයන් ද සැලකිල්ලට ගනු ලබයි.

## 2.1 අවශ්‍යතා මූලධර්මය

- "අවශ්‍යතා මූලධර්මයට" පහත යාන්ත්‍රණයන් ඇතුලත් වේ.
- විකල්ප රැකවරණ පද්ධතියට දරුවකු ඇතුල්වීම වලකාලීමට උත්සහ කරන යාන්ත්‍රණයන්.
- දරුවකුහට විකල්ප රැකවරණ සේවා සැපයීමට ප්‍රථමයෙන්, එම දරුවා සිය දෙමාපිය සෙවනෙහි ම රඳවා තැබීම සඳහා ගතහැකි අනෙකුත් සියලු විසඳුම් සලකා බැලෙන බව තහවුරු කෙරෙන්නා වූ, ශක්තිමත් ද්වාර පාලන යාන්ත්‍රණයන් ඇති කිරීම.
- දරුවකුගේ ස්ථානගත කිරීම සම්බන්ධ සියලු තීරණ ගැනීම් වලදී දරුවාට ඔහුගේ/ ඇය ගේ ශක්‍යතාවයට අනුව සහභාගී වීමට අයිතිය ඇති බව පිලිගැනීම.
- දරුවකුහට විකල්ප රැකවරණ සැලසීමේ අවශ්‍යතාවය තීරණය කිරීම සඳහා ශක්තිමත් හා පරිපූර්ණ ඇගැයීමක් සිදු කිරීමේ අවශ්‍යතාවය හා බහු-විෂය කණ්ඩායම් ප්‍රවේශයක අවශ්‍යතාවය අවධාරණය කිරීම.

## 2.2 යෝග්‍යතා මූලධර්මය

"යෝග්‍යතා මූලධර්මය" පදනම් වී ඇති පූර්ව ප්‍රකාශයන්:

- දරුවකු තම න්‍යෂ්ටික පවුල තුල තැබීම හිතකර නොවන්නේ නම්, දරුවාගේ පූර්ණ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා, වඩාත් ම සුදුසු විකල්ප රැකවරණ විසඳුම උද්දේශනය කෙරෙනු ඇත.
- විකල්ප රැකවරණය සැලසීම අවශ්‍ය බව තීරණය කරනු ලැබූ විට, දරුවාගේ උපරිම යහපත සැලකිල්ලට ගනිමින් වඩාත් ම සුදුසු විසඳුම දරුවාගේ සහභාගීත්වය ඇතිව තෝරා ගැනීම.
- විකල්ප රැකවරණය එකම විසඳුම වන්නේ නම්, නව පරිසරයට දරුවාගේ හැඩගැසී ම තහවුරු කිරීම පිනිස වරින් වර සමාලෝචනය කිරීම හා ඇගයීම සිදු කිරීම අවශ්‍ය වේ.

## 2.3 හරයන් හා මූලධර්ම

මෙම විකල්ප රැකරවණ ප්‍රතිපත්තිය මගින් සහතික කොට ඇති හරයන් හා මූලධර්ම පහත සඳහන් වේ.

- **දරුවා ගේ උපරිම යහපත** - සෑම තීරණ ගැනීමක දීම දරුවා ගේ උපරිම යහපත මුලින් ම සලකා බැලෙන බවට තහවුරු වීම.
- **පවුල** - දරුවකුහට පවුල් පරිසරයක් තුල ජීවත් වීමට ඉඩ සලසා දීම සඳහා සියලු ප්‍රයත්නයන් දැරීම.
- **රැකවරණය** - දරුවකු ගේ ආරක්ෂාව හා ශුභසාධනය රැක ගැනීම.
- **සවිබල ගැන්වීම** - පුහුණු කිරීම් තුලින් ධාරිතා සංවර්ධනය කිරීම හා දරුවන්, රැකබලා ගන්නන් හා සමාජ වැඩකරුවන් හට සම්පත් වෙන් කිරීම.
- **සියල්ලන් අන්තර්ගත වීම** - පූර්ව මත නොතකමින් කොන්දේසි විරහිත ව පිලිගැනීම.
- **සහභාගීත්වය** - තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී දරුවාගේ අදහස් විමසීම හා සිදු කිරීමට බලාපොරොත්තු වන වෙනස්කම් දරුවාට දැනුම්දීම.
- **වෙනස් කොට නොසැලකීම** - දරුවකු ගේ තත්ත්වයට හෝ තරාතිරමට පක්ෂක්ග්‍රාහී නොවී දරුවා ගේ අයිතීන් ආරක්ෂා කිරීම.
- **සහය දීම** - පවුල්වලට තම දරුවා/ දරුවන් ඇති දැඩි කර ගැනීම සඳහා ආධාර දීම.
- **උද්දේශනය** - සෑම දරුවකුගේම අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීම.
- **පරිපූර්ණ වීම** - විශාල පරාසයක වූ රැකවරණ විකල්පයන් ඉදිරිපත් කිරීම.
- **අධීක්ෂණය** - නිතිපතා සමාලෝචන සිදු කිරීම හා වගවීම.

- **පෞද්ගලිකත්වය** - තොරතුරු රහසිගත ව තබා ගැනීම.
- **ගුණාත්මකබව** - හිතකර පරිසරයන් තුල වූ ගුණාත්මක පවුල් සහයයන්/ විකල්ප රැකවරණ සේවාවන්.
- **සහයෝගීත්වය** - දරුවන්හට සේවා සපයන සියල්ලන් කණ්ඩායමක් ලෙස ප්‍රයත්න දැරීම සිදු කිරීම

විකල්ප රැකවරණය නොවැලැක්විය හැකි විට, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි ප්‍රධාන මූලධර්ම වන

- දරුවා ගේ උපරිම යහපත සැලසීම.
- වෙනස් කොට නොසැලකීම.
- ජීවත්වීමට, සංවර්ධනයට හා ආරක්ෂා වීමට ඇති අයිතිය.
- දරුවා ගේ සංවර්ධනයේ දී ඔහුගේ/ඇයගේ සහභාගී වීම.

යන සතරට අනුකූලව නේවාසික රැකවරණයන් සඳහා අවම ප්‍රමිතීන් හා මාර්ගෝපදේශයන් ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය කිරීම හා ඇගයීම සිදු කල යුතුය.

මෙම මූලධර්ම ක්‍රියාවට නංවන අතර ම, ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි අනෙකුත් අංගයන් එක් කර ගැනීම ද අවශ්‍ය වේ:

- දරුවාගේ වර්ධනය සම්බන්ධයෙන් මෙන් ම ඔහුගේ/ඇයගේ ජාතිය, සංස්කෘතිය හා භාෂාමය පසුබිම සම්බන්ධයෙන් ද නිසි සැලකීම ලබා දීම.
- විකල්ප රැකවරණ සැලසීමේ දී දරුවා ගේ පවුල් සංස්ථාවට වඩාත්ම සමීප පරිසරයක දරුවා රැඳවීම.
- නිවැරදි සහ යාවත්කාලීන කල වාර්තා හා ලිපි ගොනු පවත්වා ගැනීමේ අවශ්‍යතාවය හේතුකොට ගෙන හැකි සැමවිට ම විකල්ප රැකරවරණයන්හී සිටින දරුවන් සහ ඔවුන් ගේ දෙමාපියන් අතර සබඳතා පැවැත්වීම දිරි ගැන්වීම.
- තමන්ට ලැබෙන සැලකීම් හා වෙනත් සිදුවීම් සම්බන්ධයෙන් සමාලෝචනය කිරීමට දරුවාට අයිතියක් ඇත.
- දරුවාට ඔහුගේ/ඇයගේ නිදහසට ඇති අයිතිය අහිමි නොකල යුතුය.
- විකල්ප රැකවරණයන් හී කාර්ය මණ්ඩල තෝරා ගැනීම හා පුහුණු කිරීම පරීක්ෂාකාරී ව සිදු කල යුතු අතර ඔවුන්ට නිසි අයුරින් වැටුප් ගෙවීම කල යුතුය.
- එක් එක් දරුවාහට සුවිශේෂී වූ ගති ලක්ෂණ ඇති අතර දරුවා ගේ ජීවිතයට බලපාන්නා වූ කවර හෝ තීරණයක් ගනු ලබන විට එම ගති ලක්ෂණ සැලකිල්ලට ගත යුතු ය.
- සහෝදර සහෝදරියන් වෙන් වී ජීවත්වීම සිදු නොවිය යුතු අතර නොවැලැක්විය හැකි අවස්ථාවක හැරුණ විට විකල්ප රැකවරණ සැලසීම හරහා වෙන් කිරීම නො කල යුතුය.

[4] එක්සත් ජාතීන් ගේ මහා සමුළුව (2010). 2010 පෙබරවාරි මස 24 වැනි දින මහා සමුළුව සම්මත කල දරුවන්හට විකල්ප රැකවරණය සැලසීමේ මාර්ගෝපදේශ පිලිබඳ යෝජනාව, A/RES/64/142

http://www.refworld.org/docid/4c3acd162.html. ප්‍රවේශ වීම 2017සැප්තැම්බර් 01 වැනි දා.

# දැක්ම හා ඉලක්ක

## 3.1 දැක්ම

හිතකාමී පවුල් හා ප්‍රජා පරිසරයක් තුල හැදී වැඩීම හා රැකවරණය ලැබීම සඳහා සෑම දරුවකුටම ඇති අයිතිය පිලිගැනීම හා ආරක්ෂා කිරීම.

## 3.2 ඉලක්ක

අ. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිලිබඳ සම්මුතිය මගින් පිලිගනු ලබන ආකාරයට පවුල් පරිසරයක් සඳහා දරුවන්හට ඇති අයිතිය ප්‍රවර්ධනය කිරීම හා නගා සිටු වීම.

ආ. විකල්ප රැකවරණ ආයතන සංඛ්‍යාව ක්‍රමයෙන් අවම කිරීම අරමුණු කර ගනිමින් විධිමත් වූත්, නිසි ලෙස අර්ථ දැක්වූත් ආයතනහරණ ක්‍රියාවලියක් ක්‍රියාවට නැංවීම.

ඇ. දරුවන් පෝෂණය කරන සහ ආරක්ෂාව සහිත පවුලක් තුල හා ළමා-මිතුරු ප්‍රජා පරිසරයක දරුවන්ට හැදී වැඩීම සඳහා සියලු පියවර ගෙන ඇති බවට තහවුරු වීම.

ඈ. පවුලෙන් වෙන් වීම සිදු වූ පසු දරුවන් යලි තම ස්වභාවික පවුල සමග එක් කිරීම තහවුරු කිරීම හා එසේ කිරීමට නොහැකි වූ විට ඔවුන් ගේ ආරක්ෂාව හා රැකවරණ අවශ්‍යතා පරිපූර්ණ කල හැකි වෙනත් සුදුසු පවුල් පාදක රැකවරණයක් සොයා දීම තහවුරු කිරීම.

ඉ. පවුල් පාදක ස්ථිර විසඳුමක් ලබා දීමට අපොහොසත් වූ විට හෝ එය දරුවා ගේ උපරිම යහපත සඳහා ඉවහල් නොවන විට, විකල්ප රැකවරණයන්, පලමුව පවුල් පාදක රැකවරණය, ඉන් අනතුරුව පවුලක වැනි රැකවරණය හා අවසාන ම විකල්පය ආයතනගත රැකවරණය වශයෙන් ප්‍රමුඛතාගත කොට දරුවාහට වඩාත් ම උචිත විකල්ප රැකවරණය හඳුනා ගැනෙන බවටත්, එම රැකවරණ සැලසීම එක්සත් ජාතීන් ගේ මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කෙරෙන බවටත් තහවුරු වීම.

ඊ. දරුවකුහට ආයතනගත රැකවරණය ලබාදීම අවසාන විසඳුම වශයෙන් සැලකීම සඳහාත්, එය සීමිත කාලයකට පමණක් වීම සඳහාත් අනෙකුත් විකල්ප රැකවරණ ක්‍රම සියල්ල ශක්තිමත් කිරීම.

උ. දරුවා ගේ පැවැත්ම හා සංවර්ධනය සඳහා මෙන්ම, රැකවරණ ස්ථානයන් ගෙන් පිටව යන (සමාජගත වන) යෞවනයන් සඳහා පොදු සෞඛ්‍ය සේවා, නිදහස් අධ්‍යාපනය, නීති, ආර්ථික හා උපදේශන සේවා සඳහා ප්‍රවේශය තහවුරු කිරීම.

ඌ. සියලු ප්‍රජා පාදක සමාජ ආරක්ෂණ ජාල ප්‍රවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම තුලින් අවදානම් සහගත දරුවන්හට ආරක්ෂාව හා රැකවරණය සැලසීම සඳහා ප්‍රජාව සතු හැකියාව ඉහළ නැංවීම.

# විකල්ප රැකවරණය අවශ්‍ය වන දරුවන් ගේ තත්ත්වය

දරුවන් තම දෙමාපිය සෙවනින් වෙන් කිරීමේ අවදානම් තත්ත්වයට පමුණුවන හේතු වන්නේ දරිද්‍රතාවය, නිවසක් නොමැති වීම, අපරාධ, අධ්‍යාපනය සඳහා ප්‍රවේශය අඩුවීම, මාපියන් දෙදෙනා ම හෝ එක් අයෙකු නොමැති වීම, සුදුසු රැකබලා ගන්නෙක් නොමැති වීම, දෙමාපියන් විදේශගත වීම, දෙමාපියන් සිරගත වීම, ගෘහස්ථ හිංසනය, විවාහ මත ගැටුම්, අඩු වයස් ගැබ් ගැනීම්, ආබාධිත තත්ත්වයන්, පවුලේ දීර්ඝ කාලීන රෝගී තත්ත්වයන්, ශාරීරික හා ලිංගික අපයෝජනය, අතහැර යාම, ස්වභාවික ආපදා, යුද්ධ සහ ගැටුම් වැනි තත්ත්වයන්ය. පහත දක්වා ඇති තත්ත්ව එකකට හෝ වැඩි ගණනකට නිරාවරණය වී සිටින දරුවන්, අවදානම් සහගත දරුවන් වශයෙන් සැලකිය හැකිය.

- අනාථ දරුවන්
- අත්හල දරුවන්
- ඒඩ්ස් ආසාදිත දරුවන්
- ශාරීරික, මානසික හෝ ලිංගික අපයෝජනයට ලක් වූ දරුවන්
- වීදි දරුවන්
- නීතිය සමග ගැටුම් ඇති කරගත් දරුවන්
- ළමා ලිංගික සූරා කෑමට හෝ හානිකර රැකියාවන්හී ශ්‍රම සූරා කෑමට ලක් වූ දරුවන්
- ආබාධ සහිත දරුවන්
- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ දරුවන්
- මූලික ශාරීරික හා චිත්තවේග අවශ්‍යතා සම්පූර්ණ නොවූ දරුවන්
- මාපියන්ගෙන් අයෙක් සිරගත වී සිටීම හේතුවෙන් බන්ධනාගාර පරිසරවල ජීවත්වන දරුවන්
- ළමා සරණාගතයින්
- අභ්‍යන්තර ව අවතැන් වූ දරුවන් ( යුද්ධය හා හදිසි විපත් හේතුවෙන්)

දරුවන් තම පවුල් පරිසරයෙන් වෙන් කිරීමේ අවශ්‍යතාවය අවම කිරීම සඳහා රජය සහ අනෙකුත් පාර්ශවකරුවන් විසින් ඉහත තත්ත්වයන් සහ අනෙකුත් අවදානම් තත්තවයන් ආමන්ත්‍රණය කළ යුතුය. තමාට සමීප පුද්ගලයකු හා පවතින ශක්තිමත් භාවාත්මක බැඳීම, දරුවකු ගේ ආතතිය ලිහිල් වීමට හා සන්තෘෂ්ටියට ඉවහල් වන බැවින් දරුවන් හා මාපියන් අතර ශක්තිමත් බැඳීමක් පවත්වා ගැනීම, දරුවා තුල සුරක්ෂිතබව පිලිබඳ හැඟීම් ජනිත කිරීමට හේතුවන අතිශය තීරණාත්මක සාධකයක් වේ.

නීතිය සමග ගැටුම් ඇතිකර ගත් දරුවන් හා බිඳුනු පවුල් පරිසරයක ජීවත් වන දරුවන් වැනි ඇතැම් දරුවන්හට විකල්ප රැකවරණයක ආරක්ෂාව සහ රැකවරණය අවශ්‍ය විය හැකිය. අපයෝජනයේ වින්දිත දරුවන්හට, නොසලකා හරින ලද සහ සූරා කෑමට ලක් වූ දරුවන්හට විකල්ප රැකවරණ සැලසීමේ දී ගැලපෙන සුදුසු රැකවරණ විසඳුමක් තෝරා ගත යුතුය. මානසික රෝගී තත්ත්ව, ප්‍රචන්ඩකාරී හැසිරීම හෝ ආබාධිතබව, දීර්ඝ කාලීනව ආයතනගතකර තැබීමට හේතුන් නොවේ. අපයෝජනයේ සහ සූරා කෑමේ වින්දිත දරුවන්හට සහ විශේෂ රැකවරණය හා අවධානය අවශ්‍ය දරුවන්හට අවශ්‍ය උපදේශන සේවාවන් සහ රැකවරණය ලබා දීම, ඔවුන් සිය පවුලෙන් වෙන් නොකර ප්‍රජා පරිසරය තුල ම ලබා දීමේ හැකියාව බොහෝ විට පවතී.

ශ්‍රී ලංකාවෙහි රැකවරණ විසඳුම් ගණනාවක් තිබුණ ද, දරුවකුහට ආරක්ෂාව සහ රැකවරණය අවශ්‍ය වූ විට ආයතනගත රැකවරණය ලබා දීම එකම විසඳුම වශයෙන් තෝරා ගැනීම තවමත් සිදු වෙමින් පවතී. මේ හේතුවෙන්, කෙටි කාලීන රැකවරණය අවශ්‍ය දරුවන් පවා දිගු කාලීන ව ආයතනගත කොට තැබීම සිදු වේ. ඇතැම් අවාසි සහගත තත්ත්වයන්ට ලක් වූ දරුවන්ගේ සුවිශේෂී අවශ්‍යතා අමන්ත්‍රණය කිරීම සඳහා කෙටි කාලීන නේවාසික රැකවරණයක් සැලසීම අවශ්‍ය වුව ද, බොහෝ දරුවන්හට අවශ්‍ය වනුයේ තම ස්වභාවික පවුල ශක්තිමත් කිරීමේ වැඩසටහන් හෝ පවුල් පාදක රැකවරණයන්ය.

තාවකාලික හා කෙටි කාලීන ආයතනගත රැකවරණය අවශ්‍ය දරුවන් වන්නේ සෙවනක් අවැසිව වීදියේ ජීවත්වන දරුවන්, අනාරක්ෂිත ගෘහ පරිසර තත්ත්ව යටතේ ජීවත්වන අපයෝජනයේ වින්දිත දරුවන්, ළමා ජාවාරමේ වින්දිතයින් වූ දරුවන්, නීති විරෝධී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ දරුවන්, අධිකරණ ක්‍රියාවලිය යටතේ සිටින දරුවන් සහ බහුවිධ සංවර්ධන ව්‍යාකූලතා සහිත ව සිටින විශේෂිත ප්‍රතිකාර අවශ්‍ය දරුවන්ය. ස්වභාවික ව්‍යසනයන් හා ගැටුම් ද විකල්ප රැකවරණ සැලසීමේ අවශ්‍යතාව මතු කරයි. ශ්‍රී ලංකා රජය විසින් ආමන්ත්‍රණය කල යුතු නව්‍ය ගැටලුවක් වන්නේ සරණාගතයින් හා රැකවරණය සොයා පැමිණෙන්නන් අතර වූ දරුවන් සිටින අයවලුන් ගේ ගැටලුය. එමෙන්ම, දෙමාපියන් සිරගත වී සිටීම හේතුවෙන් දරුවන් ගණනාවක්

(ලාංකික මෙන් ම ලාංකික නොවන) වැඩිහිටි සිර ගෙවල්වල සිටිති.

වසර 2014 දී, රාජ්‍ය සහ පුද්ගලික ආයතයන් මගින් ක්‍රියාත්මක කල දිවයින පුරා පිහිටි ලියාපදිංචි ළමා රැකවරණ මධ්‍යස්ථාන 414ක දරුවන් 14,179 විය. පසුගිය දශක කිහිපය තුල සිදුකල අධ්‍යයන ගණනාවක් පෙන්වා දී ඇති පරිදි ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන ළමා රැකවරණ මධ්‍යස්ථාන දෙවර්ගයෙහිම දරුවන්හට ආරක්ෂාව හා රැකවරණය සැලසීමේ උග්‍ර අඩුපාඩු පවතී. එමෙන් ම, දරුකමට හදාවඩා ගැනීමට ලබා දීම හා ගැලපෙන පුද්ගලයකු සපයා දීම වැනි විකල්ප රැකවරණයන් පැවතිය ද ඒවා ප්‍රමාණවත් ව භාවිතා නොකරන බව ද අධ්‍යයනයන් පෙන්වා දෙයි. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යංශය සහ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ළමා රැකවරණ මධ්‍යස්ථාන සම්බන්ධයෙන් මෑතක ම සිදු කල විශ්ලේෂණය පෙන්වාදෙනු ලබන්නේ, රැකවරණ මධ්‍යස්ථානයන් හී යටිතල පහසුකම් හා සේවාවන් වල වැඩිදියුණු වීමක් සිදු වී ඇති මුත් දරුවන් ගෙන් බහුතරයක් එම ස්ථානයන් හී රැඳවීමට හේතුව වී ඇත්තේ දරිද්‍රතාවය හා පවුල තුල පවතින ගැටලු බවය[1]. දෙමාපියන් සහ භාරකරුවන් ගේ අදහස වන්නේ දරුවන්හට, විශේෂයෙන් ම නව යොවුන් වියේ සිටින ගැහැණු දරුවන්හට, මෙම රැකවරණ ස්ථානයන්හී ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය මෙන් ම සාපේක්ෂව ආරක්ෂිත පරිසරයක ජීවත්වීමේ හැකියාව ඇති බවයි. එනමුත්, පවුලෙන් හා භාරකරුවන් ගෙන් වෙන් වීම මෙන්ම රැකවරණ මධ්‍යස්ථානවල වූ ආයතනගත පරිසරය හේතු කොට ගෙන දරුවන් සැලකිය යුතු මානසික හා සාමාජීය අපහසුතා පෙන්නුම් කරන බව එම වාර්තාව පෙන්වා දෙයි. එමෙන්ම, එම දරුවන්හට සමාජය පිලිබඳ අවබෝධය අඩු වීම හේතුවෙන් සහ රැකවරණ ආයතනයන් ගෙන් පිටත දී එම දරුවන්හට සහය වීම සඳහා තම පවුල හෝ සමවයස් කණ්ඩායම් සමග සබඳතා හීන වීම හේතුවෙන් මෙම දරුවන් සමාජගත කිරීම අභියෝගාත්මක වන බව ද එම වාර්තාව දක්වා ඇත. එබැවින් දරුවන්හට ආරක්ෂාව සහ රැකවරණය සැලසීම පිනිස ආයතනගත රැකවරණය මත යැපීම අඩු කිරීම සඳහා උචිත විකල්ප රැකවරණයන් ප්‍රමාණවත් පරිදි ඇති කිරීමේ හා ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය මෙම සොයා ගැනීම් ද ඉස්මතු කොට දක්වා සිටියි.

විකල්ප රැකවරණයන් වෙත දරුවන් යොමු කිරීමේ දැනට පවතින ක්‍රමවේදයෙහි මෙන්ම ළමා රැකවරණ මධ්‍යස්ථානයන් හී දරුවන් රඳවා තැබීමෙහි ද බොහෝ අඩුපාඩුකම් පවතී. යෝජිත ළමා ආරක්ෂාව සහ යුක්තිය පසඳලීම පිලිබඳ නීතිය මගින් වින්දිතයින් බවට පත් දරුවන්, නීතිය සමග ගැටුම් ඇති කර ගත් දරුවන් ගෙන් වෙන් කර රැඳවීම සඳහා නව විධිවිධාන සලසා ඇතත්, සහතික කල පාසැල් හා රැඳවුම් නිවාස වැනි බොහෝ නේවාසික රැකවරණයන්හී, අපයෝජනයේ වින්දිත දරුවන්හට සෙවන සැලසීම සිදු කෙරෙනුයේ නීතිය සමග ගැටුම් ඇති කරගත් දරුවන් හා සමගය. පවතින නීතිය මගින් සුළු වැරදි කල දරුවන් සඳහා වෙනත් විකල්ප සලසා තිබියදීත්, පොල් ගෙඩියක් හෝ පාන් ගෙඩියක් සොරකම් කිරීම වැනි සුලු වරදකට වරදකරුවන් වූ දරුවන්හට ද වඩාත් බරපතල වැරදි සඳහා වරදකරුවන් වූ දරුවන්හට වූ ආයතනගත රැකවරණය ම ලබා දීම සිදු කෙරේ[1]. දරුවන් කාර්යාල වේලාවෙන් පසු ව හෝ සති අන්තයේ දී හෝ අත්අඩංගුවට ගනු ලැබූවිට ඔවුන් අධිකරණය හමුවට පමුණුවන තෙක් පොලිස් සිර මැදිරිවල ප්‍රමාණවත් නිදන පහසුකම් රහිතව රඳවා තැබීම ඇතැම් අවස්ථාවන් හී සිදු වේ. දරුවන් වැඩිහිටි සිරකරුවන් සමග එකම වාහනයේ ප්‍රවාහනය කිරීම නිරන්තරයෙන් සිදු කෙරේ. කෙසේ වුව ද, ඉහත සඳහන් කරන ලද යෝජිත නීතිය මගින් පලාත් පරිවාස කොමසාරිස්වරුන් හට දරුවන් ප්‍රවාහනය කිරීමේ වගකීම ලබා දීමට විධිවිධාන සලසා ඇත.

බොහෝ ළමා රැකවරණ කාර්ය මණ්ඩල පිරිස් ඉතා කැපවීමෙන් කටයුතු කල ද, රාජකාරී කටයුතුවල බහුලත්වය හේතු කොට ගෙන මොවුන්ගෙන් බොහොමයක් මානසික ආතතියට පත් ව සිටිති. බොහොමයක් පිරිස් ආතතියෙන් යුත් වටපිටාවක සේවය කරන අතර ප්‍රමාණවත් ලෙස අධීක්ෂණය සහ තාක්ෂණික සහය ලබා දීම සඳහා සම්පත් ප්‍රමාණවත් ව නොමැත. බොහොමයක් ළමා රැකවරණ සේවක පිරිස්හට ප්‍රමාණවත් අධ්‍යාපනයක් මෙන්ම සමාජ වැඩ පිලිබඳ නිපුණත්වයක් ද නොමැති අතර එය ද මෙම අසීරු තත්ත්වයට හේතු වෙයි. ආයතනයන්හී රැකවරණ සපයන්නන් විසින් දරුවන් ශාරීරික දණ්ඩනය ලක් කිරීම හා අපයෝජනයට ලක් කිරීම පිලිබඳ වාර්තා වූ සිද්ධි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සතුව පවතී[1]. වින්දිත දරුවන් ආයතනයන් තුල දී ද්විතියික ව අපයෝජනයට ලක්වීම වැලැක්වීම පිනිස, රැකවරණ සපයන්නන් වගවීමට බැඳ තබන ශක්තිමත් අධීක්ෂණ ක්‍රමවේදයක දැඩි අවශ්‍යතාවයක් පවතී. එමෙන් ම රැකවරණ සපයන්නන් සඳහා පුහුණු වීම් හා අධ්‍යාපනය ලබා දීමේ ද තදබල අවශ්‍යතාවයක් පවතින අතර ම සුදුසුකම් සහිත පුද්ගලයින් ළමා රැකවරණ ක්ෂේත්‍රයට ආකර්ශණය කර ගැනීම සඳහා සුදුසු පරිදි සම්පත් වෙන් කිරීම ද කල යුතුය.

දරුවන් ආයතනගත වීමෙන් වලකා ගැනීම සඳහා සහ දරුවන්හට විකල්ප රැකවරණ සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් අතර සම්බන්ධතාවයන්හී බිඳ වැටීම් පවතී. එමෙන්ම

දරුවන්ට රැකවරණ සැලසීමේ යාන්ත්‍රණයන්හි සහ සේවා සැපයීම් වල ද අඩුපාඩු දැකිය හැකිය. දරුවන් අනවශ්‍ය ලෙස රැකවරණ ආයතනයන්ට ඇතුලත් කිරීම වැලැක්වීම සඳහා සාර්ථක දොරටු පාලනය කිරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම ද අත්‍යවශ්‍ය වේ.

මීට අමතර ව, දෙමාපියන් හා භාරකරුවන් හට ඔවුන් ගේ දරුවන් තම නිවෙස්වල ම රඳවා ගැනීමේ හැකියාව සලසා දීම සඳහා, අවශ්‍යතාවය සහිත පවුල් ශක්තිමත් කිරීමේ වැඩසටහන් හා දරුවන් ආයතනගත කිරීම වලකාලන වැඩසටහන් සකස් කල යුතු වේ. එවැනි පවුල් ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග ගණනාවක් රජය විසින් ක්‍රියාවට නංවා ඇත. පවුල් සංස්ථාවන් හී දරිද්‍රතාවය හා අවදානම් තත්ත්වයන්ට පාත්‍රී බව පහත දැමීම ඉලක්ක කර ගත්, දෙපාර්තමේන්තු එකොලහකට අධික සංඛ්‍යාවකින් අධීක්ෂණය කෙරෙන, සුභසාධන වැඩසටහන් තිහකට අධික සංඛ්‍යාවක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී[1]. මූල්‍යමය ආධාර වැඩසටහන් දරුවන් ආයතනගත වීම වලක්වා ගැනීමේ වඩාත් ඵලදායී ක්‍රමවේදයක් වුව ද, බොහෝ අවස්ථාවල දී එම වැඩසටහන් නිසි ඉලක්කයන්ට යොමු නොවීමත්, අදාල තොරතුරු පරිඝනකගත කිරීම නිරතුරු සිදු නොවීමත් අසම්පූර්ණ අධීක්ෂණයට, සම්බන්ධීකරණයට හා ප්‍රගතිය මැන බැලීමට හේතුවේ. 2012/13 ගෘහ ඒකක ආදායම සහ වියදම පිලිබඳව සිදුකල සමීක්ෂණයේ දත්තයන්ට අනුව නිවාස ඒකක 6.7% ප්‍රතිශතයක් දර්ද්‍රතා රේඛාවට පහලින් සිටිය ද සමෘද්ධි ආධාර හිමිවනුයේ ඉන් 16% කට පමණි[1]. එමෙන්ම, ඉතා දිලිඳු පංචමකයෙන් තුනෙන් දෙකකට ආසන්න කොටසක් කිසිදු සමෘද්ධි ආධාර මුදලක් නොලබන අතර ඇතැම් ප්‍රතිලාභීන් ආධාර ලැබිය යුතු කාල සීමාව ඉක්මවා ප්‍රතිලාභ ලබන තත්ත්වය හේතුවෙන් සමහරෙක් කිසි දිනක මෙම ආධාරවලට හිමිකම් නොකියයි. මෙවැනි සමාජ ආධාර වැඩසටහන් සම්බන්ධයෙන් මහජනතාව තුල වූ දැනුවත්බව වැඩිකල යුතු බවට ද ඉල්ලීමක් වෙයි. විශේෂයෙන්ම විවිධ සමාජ ගැටලු සම්බන්ධයෙන් පාසැල් විෂයමාලා ඔස්සේ සිසුන් හා ගුරුවරුන්හට අධ්‍යාපනය ලබා දීම තුලින්, ආයතනගත වීම වැලැක්වීමේත් දැනුවත් කිරීමේත් ක්‍රියාමාර්ග වැඩි වශයෙන් ගැනීම ද අවශ්‍ය වේ.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ඉහතින් විස්තර කරන ලද සන්ධර්භය නිරීක්ෂණය කරමින් ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය දරුවන් ගේ මෙන් ම නීතිය සමග ගැටුම් ඇති කර ගත් සියලු දරුවන් ගේ අයිතිවාසිකම් පරිපූර්ණ කිරීම හා නගා සිටුවීම සඳහා ප්‍රජා පාදක රැකවරණයන් ගණනාවක් ගෙනහැර දක්වන්නා වූ මෙම විකල්ප රැකවරණ ජාතික ප්‍රතිපත්තිය සැකසීම අරඹන ලදී.

[5] ජාතික සමාජ සංවර්ධන ආයතනය (2013). ශ්‍රී ලංකාවේ විකල්ප ළමා රැකවරණ ආයතනයන් හී සහ ආයතනගත දරුවන් ගේ තත්ත්වය විශ්ලේශණය. පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව.

[6] See for instance, Vijay Samaraweera (); Save the Children, Home Truths: Child Rights in Institutional Care in Sri Lanka (2005) C.Rocella (); Ministry of Women and Child Affairs (2013); Ariyadasa ().

[7] ජාතික සමාජ සංවර්ධන ආයතනය (2013). ශ්‍රී ලංකාවේ විකල්ප ළමා රැකවරණ ආයතනයන් හී සහ ආයතනගත දරුවන් ගේ තත්ත්වය: තත්ත්ව විශ්ලේශණය. පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව.

[8] උදා. වශයෙන් දරුවන් හා යෞවනයන් පිලිබඳ ආඥාපනත

[9] මානව හිමිකම් කොමිෂන් සභාව (2016). නිදහස අහිමි වූ දරුවන්: බහු විෂය අධ්‍යයනයකි, ශ්‍රී ලංකාව.

[10] The World Bank Group (2017). Sri Lanka Poverty and Welfare (Recent Progress and Remaining Challenges, Washington D.C. USA.

[11] ඉහත මූලාශ්‍රයම.

[12] The National Welfare Benefit Board of the Ministry of Finance is in the process of developing criteria for a comprehensive social protection system to enable better identification of individuals and families in need of social protection.

[13] ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව. 8 වන පරිච්ඡේදය, සමාජ ආරක්ෂාව. ජනතා ආයෝජන වැඩසටහන (2017-2020). ශ්‍රී ලංකාව. 127-136 පිටු


COURT - 02
බාලිකා නිවාසය
Sanjeewani

## 5.1 විකල්ප රැකවරණය අර්ථ දැක්වීම

විකල්ප රැකවරණය යනු, අධිකරණය හෝ එවැනි බලයක් ලබා දී ඇති ආයතනයක් මගින් දෙනු ලැබූ තීරණයක් මත හෝ දරුවා ගේ, දෙමාපියන්/ භාරකරුවන් ගේ හෝ දෙමාපියන් නොමැති අවස්ථාවක රැකවරණ සපයන්නෙකු ගේ මූලිකවීමෙන්, දෙමාපිය සෙවනින් පරිබාහිර ව දරුවකුහට විධිමත් හෝ අවිධිමත් රැකවරණ සැලසීමක් වේ[14]. එක්සත් ජාතීන් ගේ විකල්ප රැකවරණ මාර්ගෝපදේශය, විධිමත් හා අවිධිමත් යන රැකවරණයන් දෙ ආකාරය ම අර්ථ දක්වා ඇත. අවිධිමත් රැකවරණයට, දරුවාගේ මව,පියා හෝ භාරකරුවකු විසින් ඥාතියකු හෝ මිත්‍රයකු සමීපයෙහි, කාල නිර්ණය කිරීමකින් තොරව තම දරුවා හට රැකවරණය සැලසීම සඳහා පෞද්ගලික ව සිදු කර ගනු ලබන ඥාති රැකවරණය වැනි රැකවරණ සැලසීම් අයත් වේ. නිසි පිලිගැනීමකින් යුත් රැකවරණ සලසන්නකු යටතේ ලබා දෙන සියලු රැකවරණයන් විධිමත් විකල්ප රැකවරණ වශයෙන් එම මාර්ගෝපදේශය දක්වනු ලබයි.

## 5.2 විධිමත් විකල්ප රැකවරණයන් හා පවුල් ආශ්‍රිත සහයයන්

විධිමත් විකල්ප රැකවරණ ක්‍රම, පවුල් පාදක රැකවරණ සහ පවුලක වැනි රැකවරණ වශයෙන් වර්ගීකරණය කෙරේ. පවුල් පාදක රැකවරණයන්ට ඥාති රැකවරණය, පෝෂිත රැකවරණය සහ කුලවැද්දීම අයත් වන අතර සියලු ම නේවාසික රැකවරණයන් පවුලක වැනි රැකවරණයන් වශයෙන් සැලකේ[15]. විවිධ විකල්ප රැකවරණ ක්‍රම පහතින් දක්වා ඇති අතර එය දැක්වීම සිදු කර ඇත්තේ හොඳ ම විකල්පයේ සිට  අනුපිලිවෙලිනි. දරුවකු තමා ජීවත් වන පවුල් පරිසරයෙන්  වෙන් කිරීම (විස්තෘත පවුල ද ඇතුලත්ව) අවසාන විකල්පය වශයෙන් සැලකේ. පවුල සමග ජීවත් වන දරුවකුහට සහය වීම සඳහා ඇති සේවාවන් හා යාන්ත්‍රණයන් පිලිබඳව දරුවකු තම පවුල් පරිසරයෙන් වෙන් කිරීමට පෙර සොයා බැලීම  සිදුකල යුතුවේ.

## 5.3 පවුල් පාදක රැකවරණ

පවුල් පාදක රැකවරණ සැලසීම තම ස්වභාවික පවුල තුල හෝ ඥාති පවුලක්, පෝෂිත පවුලක්, හෝ කුලවැද්දීම සිදුකල පවුලක් වැනි දැනට පවතින පවුලක් තුල ලබා දීම සිදු වේ.[16] තම සහෝදරයින්ට සහය විය හැකි සහ ඔවුන් රැකබලා ගත හැකි වැඩිමහල් දරුවන් සිටින, ළමා මූලික ගෘහයන් ද පවුල මත පදනම් වූ රැකවරණයට ඇතුලත් කල හැකියි.

### 5.3.1. ඥාති රැකවරණ

එක්සත් ජාතීන් ගේ මාර්ගෝපදේශයෙහි ඥාති රැකවරණය අර්ථ දක්වා ඇත්තේ දරුවා දන්නා හඳුනන ඥාතියකු හෝ පවුලට කිට්ටු රැකවරණ සපයන්නෙකු විසින් ලබා දෙන රැකවරණ සැලසීමක් වශයෙනි[17]. ශ්‍රී ලංකාවෙහි ඥාති රැකවරණය සැලසීම විධිමත් නොවූ ආකාරයකට සිදු කරනු ලබන අතර, දරුවන් ඥාතියකු හෝ මිතුරකු සමීපයෙහි තාවකාලිකව කෙටි හෝ ඇතැම් විට දිගු කාලයක් රඳවා තැබීමක් ලෙස එය සිදු කෙරේ[18]. ඥාති රැකවරණය සැපයීම විධිමත් නොවූ ආකාරයෙන් සිදු වීම හේතුවෙන් ශ්‍රී ලංකාවෙහි ඒ හා සම්බන්ධ දත්ත ලබා ගැනීම දුෂ්කර වේ. එබැවින්, ඥාති රැකවරණය යටතේ සිටින දරුවන් ගේ ප්‍රගතිය මැන බැලීම, පසු විපරම් කිරීම හා අධීක්ෂණය කිරීමේ කටයුතු සඳහා මෙම රැකවරණ ක්‍රමය ද විකල්ප රැකවරණ ක්‍රමවේදයෙහි අංගයක් වශයෙන් නිල මට්ටමින් හඳුනා ගැනීම වැදගත් වේ. අධිකරණ පද්ධතිය තුල සිටින ඇතැම් දරුවන්ට රැකවරණය සැලසීම සඳහා  ළමයින් හා යෞවනයන් පිලිබඳ ආඥා පනත මගින්  සුදුසු පුද්ගලයකු සුළු ගෙවීමක් සහිතව පත් කෙරේ. මෙම සුදුසු පුද්ගලයා වශයෙන් ඥාති නොවන අයකු යොදා ගැනීමට නීතිය මගින් ප්‍රතිපාදන සපයා තිබුණ ද, ප්‍රායෝගික ව සිදුවන්නේ දරුවාට ඥාති සම්බන්ධකමක් සහිත අයෙකු මෙම සුදුසු පුද්ගලයා වශයෙන් යොදා ගැනීමයි. මෙම කාර්යය ඉටුකිරීම සඳහා ඥාති නොවන පුද්ගලයින් හඳුනා ගැනීමේ යාන්ත්‍රණයක් නොමැති බැවින්  දරුවන් ඥාති නොවන පුද්ගලයින් සමග තැබීමට නිලධරයින් මැලිකමක් දක්වයි. එබැවින් මෙම විධිමත් රැකවරණ සැලසීම ද, ප්‍රායෝගික යෙදවීමේ දී ඥාති රැකවරණයට  සමාන වේ. කෙසේ වෙතත්, ස්වේච්ඡා ළමා නිවාසයන් හී රඳවා සිටින දරුවන් ගෙන් බහුතරයක් පෝෂිත රැකවරණය හෝ සුදුසු පුද්ගලයකුගේ රැකවරණය වැනි විකල්ප රැකවරණයන්ට ඉඩ නොසලසන අනත් දරු ආඥා පනතේ විධිවිධානයන්ට යටත් වන දරුවන් වේ. සුදුසු පුද්ගලයකු යන්නෙහි නිර්වචනය මෙන්ම එය සැලසීමේ අරමුණ පැහැදිලි කර ගැනීම එය විකල්ප රැකවරණ සේවාවන් සමග අනුකූලනය කිරීම සඳහා අවශ්‍ය වනු ඇත.

[14] Better Care Network (2014). New York, USA. http://www.bettercarenetwork.org/toolkit/glossaryof-key-terms. Accessed 3rd December 2017.

[15] එක්සත් ජාතීන් ගේ මහා සමුළුව (2010). 2010 පෙබරවාරි මස 24 වැනි දින මහා සමුළුව සම්මත කල දරුවන්හට විකල්ප රැකවරණය සැලසීමේ මාර්ගෝපදේශ පිලිබඳ යෝජනාව, A/RES/64/142 http://www.refworld.org/docid/4c3acd162.html. ප්‍රවේශ වීම 2017සැප්තැම්බර් 01 වැනි දා.

[16] Centre for Excellence for Looked After Children (2012). MOVING FORWARD( Implementing the Guidelines for the Alternative Care of Children, Scotland.

[17] එක්සත් ජාතීන් ගේ එමා අයිතිවාසිකම් සම්මුතිය (1989). G.A res.44/25, annex, 44 U.N. GAOR Supp. (No.49) at 167, U.N. Doc A/44/49

[18] Centre for Excellence for Looked After Children (2012). MOVING FORWARD( Implementing the Guidelines for the Alternative Care of Children, Scotland.

[19] දරුවන් හා යෞවනයන් පිලිබඳ ආඥාපනත

### 5.3.2 පෝෂිත රැකවරණ

පෝෂිත රැකවරණ අර්ථ දක්වනු ලබන්නේ බලයලත් යුවල හෝ පුද්ගලයින් විසින් ගාස්තු අය කිරීමක් සහිතව ඔවුන්ගේ නිවස තුල දී ලබා දෙන රැකවරණයන් ලෙසය. දීගු කල් සපයන පෝෂිත රැකවරණය මගින් විවිධ හේතු නිසාවෙන් කුලවද්දීම සාර්ථක විකල්පයක් නොවන්නාවූත්, පවුලක රැකවරණය වසර ගණනාවක් ලබා දීම අවශ්‍ය වන්නාවූත් විශේෂිත දරුවන්ගේ අවශ්‍යතාවය සපුරාලිය හැකිය.[20] දෙමාපිය රැකවරණය අහිමි වූ දරුවන්හට පෝෂිත රැකවරණයෙන් යහපතක් වී නොමැති බව ගෝලීය සාක්ෂි පෙන්වා දෙනු ලබයි. තව ද, පෝෂිත රැකවරණයෙහි සංස්කෘතික හා සාම්ප්‍රදායික උචිතබව පිලිබඳ මතවාද ද ශ්‍රී ලංකාවෙහි පවතී. එනමුත් වෙනත් රටවල අර්බුදයන්ට මුහුණ පෑ පවුල්වල දරුවන්හට තාවකාලික සහන සැපයීමේ යාන්ත්‍රණයක් වශයෙන් හදිසි පෝෂිත රැකවරණය සාර්ථක වී ඇත.

## 5.4 පවුලක් වැනි රැකවරණ

පවුලක් වැනි රැකවරණ වශයෙන් හඳුන්වනුයේ දරුවා ගේ ස්වභාවික හෝ විස්තෘත පවුලට පිටතින් වූ විකල්ප රැකවරණ සැලසීම්ය. සියලු ම නේවාසික රැකවරණයන් පවුලක් වැනි රැකවරණයන් වශයෙන් සැලකේ [21]. ඇතැම් අවස්ථාවන්හී දරුවන්හට පවතින වඩාත්ම යෝග්‍ය විකල්පය මෙය වන බැවින් ඇතැම් දරුවන්හට තාවකාලිකව නේවාසික රැකවරණය සැලසීම අවශ්‍ය වන බව මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය පිලිගනු ලබයි. පවුලක් වැනි රැකවරණයෙහි අරමුණ විය යුත්තේ පවුල් පරිසරයට සමාන තත්ත්ව යටතේ කුඩා කණ්ඩායම් සඳහා රැකවරණය සැලසීමයි.

ශ්‍රී ලංකාවෙහි, හදිසි අවස්ථා රැකවරණ මධ්‍යස්ථාන, ස්වේච්ඡා නිවාස, ආරක්ෂිත නිවාස, පුද්ගලික නවාතැන්, නේවාසිකාගාර, සහතික කල පාසැල්, නිවර්තන නිවාස, කණ්ඩායම් නිවාස, අනුමත නිවාස, උපදේශන මධ්‍යස්ථාන හා විවේක සත්කාර වැනි නේවාසික රැකවරණයන් ගණනාවක් වෙයි.

## 5.5 අනෙකුත් සේවාවන් සහ යාන්ත්‍රණය

### 5.5.1 කුලවැද්දීම

කුලවැද්දීම යනු යම් පුද්ගලයෙකු ගේ, සාමාන්‍යයෙන් දරුවකු ගේ, මාපියභාරකාරත්වය එම පුද්ගලයාගේ ස්වභාවික හෝ නෛතික මාපියන් ගෙන් වෙනත් පුද්ගලයකු භාර ගැනීමේ ක්‍රියාවලිය වන අතර එසේ කිරීමේ දී, දාරකත්වය ද සමගින් එම පුද්ගලයාගේ සියලු අයිතිවාසිකම් හා වගකීම් ස්වභාවික මාපියන් ගෙන් භාර ගන්නා පුද්ගලයාට ස්ථිර ලෙස මාරුවීම සිදුවේ. දරුවන් කුලවැද්දීමේ ආඥා පනතෙහි විධිවිධාන යටතේ අනාථ හෝ අත්හල දරුවන් කුලවැද්දීම සිදුකල හැකිය. විදේශීය කුලවැද්දීම්වලට වඩා දේශීය කුලවැද්දීම බහුලව සිදු කෙරෙනු දක්නට හැකි අතර එය දරුවකුගේ ජාතිය, සංස්කෘතිය, භාෂාව සඳහා වන නෛසර්ගික අයිතිය සැලකීමේ දී වැඩි ප්‍රියතාවයක් දක්වන ආකාරය ද වේ. කුලවැද්දීම සඳහා වන ඉල්ලීම් සපුරාලීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය එක් එක් පලාත අනුව වෙනස් වේ. ඇතැම් පලාත්වල දරුවන් කුලවද්දා ගැනීමට අපේක්ෂාවෙන් සිටින දෙමාපියන් ගේ දිගු පොරොත්තු ලේඛන ඇති මුත් හදාවඩා ගැනීම සඳහා සාර්ථක ගැලපීමක් සිදු කිරීමට සුදුසු දරුවන් නොවන අතර ඇතැම් පලාත්වල පොරොත්තු ලේඛන කෙටි වන අතර දරුවන් කුලවැද්දීම සඳහා ගත වන කාලය ද කෙටිය. දේශීය කුලවද්දා ගැනීමේ ක්‍රියාවලියෙහි හා ක්‍රියාපටිපාටියෙහි ප්‍රමාදවීම් සඳහා හේතුපාදක වූ කරුණු හඳුනා ගැනීමත්, පවතින බාධාවන් දරුවාගේ උපරිම යහපත සැලසීමේ මූලධර්මයට අනුකූල වෙමින් ආමන්ත්‍රණය කිරීමත් සඳහා පර්යේෂණ කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවති.

### 5.5.2 සහන මිල දිවා සුරැකුම්

දිවා සුරැකුම් වනාහී දෙමාපියන් හෝ භාරකරුවන්හට විවේකයක් ලබා දීමටත්, රැකියාවක නියැලීම ඇතුලුව වඩාත් යහපත් ජීවන තත්ත්වයක් උදාකර ගැනීමට අවස්ථාව සැලසීමටත් නිර්මාණය කරන ලද සමාජ සහය සැපයීමේ සේවාවකි. අවම මුදලක් අය කරනු ලබන මෙම සහනමිල දිවා සුරැකුම් සාමාන්‍යයෙන් අවදානම් තත්ත්වයේ සිටින පවුල් වෙනුවෙන් පැවැත්වේ. ශ්‍රී ලංකාවෙහි රජය මගින් මෙන් ම රාජ්‍ය නොවන ආයතන මගින් ද පවත්වා ගෙන යනු ලබන සහන මිල දිවා සුරැකුම් දක්නට ඇත.

### 5.5.3 පාසැල් වේලාවෙන් පසු වැඩසටහන්

පාසැල් වේලාවෙන් පසු වැඩසටහන් වූකලී දරුවන්හට පැසැල් වේලාවෙන් පසු පාසැලේ ගෙදර වැඩ කර ගැනීමටත් ජීවන නිපුණතා වැඩි දියුණු කර ගැනීමටත් ආරක්ෂිත ස්ථානයක් සපයන්නා වූ ප්‍රජා පාදක සමාජ සහය සැපයීමක් වේ. පාසැල් වේලාවෙන් පසු වැඩසටහන්, අඩු ආදයම්ලාභී පවුල්වලට අමතර සහය සැලසීමක් වේ. රජය මේවන විට දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ වූ ළමා සභා සඳහා පහසුකම් සලසාලන මුත් එහි දිවයින පුරා ම විහිදීමක් දක්නට නොලැබේ[22]. රාජ්‍ය නොවන ආයතන කිහිපයක් ද පාසැල් වේලාවෙන් පසු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒවායෙහි අඛණ්ඩ ගුණාත්මක සේවාවක් සැපයීමේ අඩුපාඩු පවතී.

---

[20] Centre for Excellence for Looked After Children (2012). MOVING FORWARD ( Implementing the Guidelines for the Alternative Care of Children, Scotland.

[21] ඉහත මූලාශ්‍රයම

[22] වෝකර් ඞී, බණ්ඩාර අයි., ඩි සිල්වා එස් (2016). ශ්‍රී ලංකාවෙහි ළමා ආරක්ෂණ ක්‍රමවේදය, සිතියම්ගත කිරීමේ වාර්තාව - අවසන් කෙටුම්පත

# 6 වන කොටස — උපායමාර්ගයන් හා ප්‍රතිපත්ති මැදිහත්කරණයන්

## 6.1 ආයතනගතවීම වැලැක්වීම

මෙම කොටස මගින් දරුවන් ආයතනගතවීම වැලැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග, විශේෂයෙන් ම දරුවන් දිගු කල් ආයතනගත කොට තැබීමට දායකවන සාධක පරාජය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග යෝග්‍යතා මූලධර්මය ඇසුරු කොට ගනිමින් ගෙන හැර දක්වයි.

6.1.1 තම පවුල් සංස්ථාවෙන් වෙන් වීමේ අවදානමක් සහිත දරුවන් හඳුනා ගැනීම සඳහා අවදානම් තත්ත්ව සිතියම්ගත කිරීමේ ක්‍රමවේදයක් ඇති කිරීම.

6.1.2 සියලු රාජ්‍ය නිලධාරීන් හා කාර්ය මණ්ඩලයන් ළමා අපයෝජන, නොසලකා හැරීම්, සූරා කෑම් හා අතහැර යාම් හඳුනා ගැනීම හා වැලැක්වීම පිලිබඳව මෙන්ම උචිත හා කාර්යක්ෂම අයුරින් නිපුණත්වයකින් යුත් ආයතනයන්ට යොමු කිරීම පිලිබඳවත් පුහුණු කර ඇති බවට තහවුරු කර ගැනීම.

6.1.3 රැකියා සඳහා යෑමට දරුවන් ආයතනගත කිරීමේ අවදානමක් සහිත දෙමාපියන් විශේෂයෙන් කේන්ද්‍ර කොට ගනිමින්, සැලකිය යුතු ජීවන තත්ත්වයක් සහිතව හා ගෞරවාන්විතව ජීවත්වීම සඳහා දෙමාපියන් සවිබල ගැන්වීම අරමුණු කරගත් ආර්ථික හා සමාජ සහය සපයන වැඩසටහන් ඇති කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

6.1.4 පෙර පාසැලේ සිට 13 වන ශේණිය දක්වා සම්පත්, ගුරු මණ්ඩලය හා අධ්‍යාපනය ප්‍රමාණවත්ව ඇති බවට තහවුරු කරගැනීම සඳහා පාසැල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම සහ දරුවන් පාසැල් පද්ධතිය තුල රඳවා තබා ගැනීම සඳහා අවශ්‍ය උපකාරක සේවාවන් ලබාදීම.

6.1.5 දරුවන්ට හිරිහැර කිරීම, අපයෝජනය, අන්තර්-පුද්ගල ගැටුම් ආදිය සියලු පාසැල් තුල සිදුවීම වැලැක්වීම සඳහා පාසැල් අධ්‍යාපනයට ජීවන කුසලතා එක් කිරීම දිරි ගැන්වීම.

6.1.6 කුඩා දරුවන් හා ඔවුන් ගේ පවුල් වෙනුවෙන් පූර්ණ පරාසයකින් යුත් පූර්ව ළමා විය සංවර්ධන වැඩසටහන් ඇති කිරීම.

6.1.7 මුල් අවස්ථාවේ දීම අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීමට හැකිවන සේ, වර්ධන දුර්වලතා පෙන්වීම සම්බන්ධ ඇගයීමකට අලුත උපන් සෑම බිලිඳෙක් ම ඉපදී මුල් මාස තුන ඇතුලත ලක් කෙරෙන බවටත්, අවම වශයෙන් වයස අවුරුදු 5 දක්වා අඛණ්ඩ ව එම ඇගයීම සිදුකෙරෙන බවටත් තහවුරු කිරීම.

6.1.8 ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය පිලිබඳ වැඩසටහන් පාසැල් තුල හා ප්‍රජාව තුල පැවැත්වීම ද ඇතුළුව ළමා මවුවරුන්, තනි මාපිය හා ඔවුන් ගේ දරුවන්හට සහය වීම සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම සහ ඔවුන් සමාජ අපහාසයට ලක් වීම අඩු කිරීමට ප්‍රයත්න දැරීම හා ඔවුන්හට දරුවන් සමග පවුලක් සේ ජීවත් වීමට ඉඩ සැලසීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම.

6.1.9 වීදිගත දරුවන් හා ඔවුන් ගේ දෙමාපියන්හට වීදියේ ජීවත් වීමෙහි ඇති අවදානම පිලිබඳ අවබෝධය ඇති කිරීම සඳහා විශේෂිත වැඩසටහන් නිර්මාණය කිරීම හා විකල්ප වාසස්ථාන හා වෙනත් ආදායම් මාර්ග සඳහා උනන්දු කරවීම.

6.1.10 මත්ද්‍රව්‍ය හා මත්පැන් සඳහා ඇබ්බැහි වීම, අන්තර්ජාල ක්‍රීඩා, අසභ්‍ය දර්ශන, ලිංගික අධ්‍යාපනය හා ළමා අපචාර යනාදිය පිලිබඳ ව වයසට සරිලන අයුරින් දරුවන් සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් හා අධ්‍යාපනික පුහුණු වැඩසටහන් නිර්මාණය කිරීම.

6.1.11 සියලු මාතෘ ප්‍රතිලාභයන්, සෞඛ්‍ය ආරක්ෂක යාන්ත්‍රණයන් සහ ආර්ථික සහය සැලසීමේ ව්‍යාපෘතීන් විසින් තනි මවුවරුන්, දරිද්‍රතාවයෙන් යුත් පවුල්වල මවුවරුන් හා ගෘහස්ථ හිංසනයේ වින්දිත මවුවරුන් වෙත විශේෂ අවධානය යොමු කරන බවට තහවුරු කර ගැනීම.

6.1.12 පවුල තාවකාලික ව වෙන් වන අවස්ථාවල දී (උදා. රැකියා සඳහා විදේශගත වීම) ඥාති රැකවරණය වැනි පවුල් පාදක රැකවරණයන් සැලසීමේ හැකියාව සොයා බැලීමට දෙමාපියන් දිරි ගැන්වීම සඳහා වැඩසටහන් නිර්මාණය කිරිම හා ක්‍රියාත්මක කිරීම.

6.1.13 රාජ්‍ය හා රාජ්‍ය නොවන සේවා සපයන්නන් යන දෙපිරිසම සිතියම්ගත කොට සියලු සේවා සපයන්නන් අතර සම්බන්ධීකරණය හා සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාල සේවාවන් වෙත යොමු කිරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම.

## 6.2 ද්වාර පාලනය

ද්වාර පාලනය යනු, දරුවකු ආයතනික රැකවරණයට යටත් කිරීමේ තීරණ ක්‍රියාවලියට සම්බන්ධ වන සියලු පාර්ශවයන් විසින්, "යෝග්‍යතා මූලධර්මය" පිළිපදිමින්, දරුවකුහට වඩාත්ම යෝග්‍ය රැකවරණය තීරණය කිරීම සඳහා සිද්ධි කලමණාකරන යාන්ත්‍රණ, ඇගයීම් ක්‍රියාවලිය, මූල්‍ය සහයන් ලබා දීම වැනි සියලු ක්‍රියාමාර්ග ගනු ලබන බවට තහවුරු කර ගැනීමයි.

6.2.1 ද්වාර පාලන යාන්ත්‍රණ ශක්තිමත් කිරීම පිනිස අවදානම් සහගත තත්ත්වයන් හී සිටින දරුවන් සම්බන්ධයෙන් පවතින්නා වූ ජාතික හා පළාත් නීති හා රෙගුලාසි සමාලෝචනය කොට ඒවා ඒක රේඛීය කිරීම.

6.2.2 දේශීය කුලවද්දා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පවතින කුලවද්දා ගැනීමේ නීති සංශෝධනය කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම.

6.2.3 දරුවකු ආයතනගත කිරීමට පෙර එහි අවශ්‍යතාවය සහිත දරුවන් නිවැරදිව හඳුනා ගැනීම, ප්‍රායෝගික යාන්ත්‍රණයන් (දරුවා සහ පවුල ඇගයීම සහ ආරක්ෂණ සැලසුම් සකස් කිරීම ඇතුලුව), ආයතනික සැකසුම් සහ විධිමත් ද්වාර පාලන ක්‍රමවේදයක තිබිය යුතු සම්බන්ධීකරණ ව්‍යුහය යනාදියට අදාල ව බහුවිධ ප්‍රවේශයක් අනුගමනය කරන්නා වූ මාර්ගෝපදේශ හා අවම ජාතික ප්‍රමිතීන් ගොඩ නැගීම.

6.2.4 වෙනත් රටකට කැටුව යන ලද සහ මෙරටට කැටුව එන ලද දරුවන් ගේ ගැටලු, එසේ කැටුව ඒමට හෝ යාමට අදාල වූ හේතු සලකා බැලීමකින් තොරව ද, වැඩිහිටියකු විසින් කැටුව නොපැමිණි හෝ පවුලෙන් වෙන් කරනු ලැබූ යනාදී කරුණු නොසලකා හරිමින්, නියාමණය කිරීම සඳහා සුවිශේෂී මාර්ගෝපදේශ ගොඩ නැගීම.

6.2.5 දරුවන් සරණාගතයින් බවට පත්වීම සහ ස්වකැමැත්තෙන් හෝ ස්වකැමැත්තෙන් තොරව තම මුල් රැකබලා ගන්නවුන් ගෙන් වෙන් වීම වැලැක්වීම පිනිස ක්‍රියාමාර්ග ගැනීම සහ ස්වභාවික විපත් ඇතුළුව, හදිසි අවස්ථා වලදී අවශ්‍ය පරිදි කෙටි හෝ දිගු කාලීන විකල්ප රැකවරණයන් සැපයීම.

6.2.6 දරුවකු තම පවුල හා සමාජය වෙත සමාජගත කිරීම ප්‍රමාද වීමේ අවදානමක් ඇති පවුල් සඳහා ආර්ථික සහ සමාජයීය සහය ලබා දීමට ප්‍රමුඛත්වය දීම.

යම් දෙමාපියකු/භාරකරුවකු සිය දෙමාපිය වගකීම් හා බැඳීම් ඉටු කිරීමට සූදානම් වන තුරු, දරුවාහට තාවකාලික නිවාසයක් අවශ්‍ය වූ අවස්ථාවන් වැනි තත්ත්වයන්හි දී, ඥාති රැකවරණය හෝ හදිසි පෝෂිත රැකවරණය වැනි, පවුල් පාදක රැකවරණ විකල්පයන් දිරිගැන්වීම හා සහය දීම.

## 6.3 විකල්ප රැකවරණ පද්ධතිය තුල සිටින දරුවන්

මෙම කොටස දෙමාපිය ආරක්ෂාව හා රැකවරණය අහිමි දරුවන්හට විකල්ප රැකවරණ සැලසීම හා සම්බන්ධව වේ.

6.3.1 උසාවි නියෝගයක් හෝ පරිවාස කොමසාරිස්වරයා ගේ නියෝගයක් නොමැතිව දරුවකු සෘජුව ම රැකවරණ ආයතනයන්ට භාර නොගත යුතු බව සඳහන් නීතිය දැඩිව අධීක්ෂණය කෙරෙන යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම.

6.3.2 සෑම විකල්ප රැකවරණ සැලසීමක දීම දෙමාපියන්/ භාරකරුවන් හා දරුවන් ගේ දැනුවත් කැමැත්ත ලබා ගන්නා බවටත්, එම විකල්ප රැකවරණය තුල ඇති තත්ත්වය පිලිබඳ ව ඔවුන් සම්පූර්ණයෙන් ම දැනුවත් කෙරෙන බවටත් තහවුරු වීම සහ ඔවුන්හට, අදාල සිද්ධියෙහි නෛතික ලේඛනයන්ට ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කිරීම.

6.3.3 විකල්ප රැකවරණ ක්‍රමය තුල සිටින සියලු දරුවන් ගේ උප්පැන්න සහතිකය, ළමා වර්ධක කාඩ්පත, හැඳුනුම් පත ආදී අත්‍යවශ්‍ය නෛතික ලේඛණයන් සහිත බවට තහවුරු වීම.

6.3.4 විකල්ප රැකවරණ සැලසීම් සැපයීමට අදාල අවම ප්‍රමිතීන් හෝ පිලිපදින බවට තහවුරු වීම.

6.3.5 විකල්ප රැකවරණයන් තුල සිටින දරුවන්හට තම දෙමාපියන්/භාරකරුවන් සමග සම්බන්ධතා නොමැති විට හෝ සම්බන්ධතාවය පැවැත්වීමට අවස්ථාව නොමැති විට තම ස්වභාවික පවුල පිලිබඳ යාවත්කාලීන තොරතුරු සඳහා ප්‍රවේශය සපයා දෙන බවට තහවුරු වීම හා දෙමාපියන් දිගු කල් රෝහල්ගත වීම හෝ සිරගත වීම හේතුවෙන් දරුවන් පවුලෙන් වෙන් වීම සිදු වන විට ඔවුන්හට මනෝවෛද්‍යමය සහයන් සඳහා ප්‍රවේශය ඇති බවට තහවුරු වීම.

6.3.6 නිවසින් පිටත ස්ථානයක රඳවා සිටින දරුවකු නැවත පවුල සමග එක් කෙරෙන තුරු එම දරුවා ගේ මාපියන් ගෙන් අයකු/ භාරකරු, දෙමාපියන්/භාරකරුවන් නොමැති විට ඥාතියකු

හෝ අධිකරණය පත් කල භාරකරුවකු, අවම වශයෙන් මසකට වරක් අනිවාර්යයෙන් දරුවා බැලීම පිනිස පැමිණීමටත්, නිරන්තරයෙන් සම්බන්ධතා පැවැත්වීමටත් කැමැතිකර ගැනීම අත්‍යවශ්‍යයෙන් සිදුවන බවට තහවුරු කර ගැනීම.

6.3.7 සිය දරුවා බැලීම සඳහා පැමිණීමට නොහැකි හෝ අකමැති දෙමාපියන් පිලිබඳව අධීක්ෂණය කිරීම, පසු විපරම් කිරීම සහ ඔවුන්හට සහය වීම සඳහා දරුවන් සම්බන්ධයෙන් වගකීම් දරන නිලධාරීන් සවිබල ගැන්වීම.

6.3.8 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයින් හා සාක්ෂිකරුවන් හට සහය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතෙහි විධිවිධානයන්, උචිත අවස්ථාවන් හි දී දරුවන්ට අදාලව භාවිතයට ගැනෙන බවට වගබලා ගැනීම.

6.3.9 විකල්ප රැකවරණයන්ට ඇතුලු වන දරුවන් හට ඔවුන් ගේ පරිනත බවට අනුරූපීයව, තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීම සඳහා අවස්ථාව ලබා දීම සිදු කරන්න. දරුවකු තීරණ ගැනීම සඳහා කුඩා වැඩි නම් හෝ අනාථ දරුවකු නම් හෝ සහයවීම සඳහා ඥාතියකු නොමැති නම් හෝ , විකල්ප රැකවරණ සපයනු ලබන්නා විසින් අදාල තීරණ ගැනීම සිදු කරනු වෙනුවට, දරුවා දැනුවත් කරමින් ඔහුට තීරණ ගැනීමට සහයවීම සඳහා අධිකරණය මගින් පත් කරනු ලැබූ අද්වකාත්වරයකු පත් කරන්න. තීරණ ගැනීම සිදු කල යුත්තේ අධිකරණමය, පරිපාලනමය හෝ වෙනත් පිලිගත් ක්‍රියාපටිපාටික් හරහා, දරුවා වෙනුවෙන් පෙනී සිටින නෛතික නියෝජනයක් ඇතුලු නෛතික ආරක්ෂක පියවරයන් ද සහිතවය.

6.3.10 ළමා මූලික පවුල් වෙනුවෙන් පෙනී සිටීම සඳහා නෛතික භාරකරුවකු පත් කර එම දරුවන් අපයෝජනයන් ගෙන් හා සූරා කෑමට ලක් වීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා විධිවිධාන සලසන්න; මෙම දරුවන් හට සෞඛ්‍ය, නිවාස, අධ්‍යාපනය හා උරුමයන්ට ඇති අයිතිය යනාදිය සඳහා ප්‍රවේශය සහතික කරන්න. දෙමාපියන්/භාරකරුවන් අහිමි වූ පසු, වැඩිමහල් දරුවා ගෘහ මූලිකයා වශයෙන් කටයුතු කිරීමට මනාප නම් හා හැකියාවෙන් යුක්ත නම්, එම දරුවා සමග නිවසේ ම විසීමට තීරණය කරන සහෝදර සහෝදරයින්හට සහයයන් සැපයීම සිදුවන බවට තහවුරු වීම සහ ගෘහ මූලිකයන් වන දරුවන් හට විශේෂ අවධානය ලබා දෙන බවටත්, එම දරුවාට විවේකය හා අධ්‍යාපනය ඇතුලු ළමාවියට අදාල අයිතිවාසිකම් සහිත වන බවටත් තහවුරු කර ගැනීම.

6.3.11 වැඩිහිටියකු විසින් කැටුව නොපැමිණි දරුවන් හට, පවුලෙන් වෙන් වී ඇති දරුවන්හට හා ළමා ජාවාරමේ වින්දිත දරුවන් හට සහය සැලසීම් සිදුකිරීමේ දී එක් එක් සිද්ධියට අදාල වන ලෙසින් එය සිදු කිරීම හා නීතිවිරෝධී ලෙස රටට ඇතුලු වූ දරුවන්, නීතිය උල්ලංඝණය කිරීමේ වරදට සිරභාරයට ගැනීමෙන් හෝ වෙනත් දඬුවමකට යටත් කිරීමෙන් ආරක්ෂා කර ගැනීම. දරුවා ගේ ආරක්ෂාවට අවදානමක් පවතීනම්, වැඩිහිටියකු විසින් කැටුව නොපැමිණි දරුවන් මෙන්ම පවුලෙන් වෙන් ව ඇති දරුවන් ඔහුගේ/ඇය ගේ මුල් රටට නැවත පිටත් කර නොයැවීමට යාන්ත්‍රණයන් තිබිය යුතුය; වැඩිහිටියකු විසින් කැටුව නොපැමිණි දරුවන් හා පවුලෙන් වෙන් ව ඇති දරුවන් ගේ භාරකාරත්වය නීතිගත කිරීම හා දරුවාගේ ආරක්ෂාව සම්බන්ධ කරුනු පිලිබඳ සැලකිලිමත් වෙමින් දරුවාගේ පවුල සොයා දීමට පියවර ගැනීම; දරුවාට අඛණ්ඩව රැකවරණය සැලසීම සඳහා රටවල් අතර සහ අදාල ආයතන අතර සහයෝගීත්වය දිරි ගැන්වීම.

6.3.12 විධිමත් නොවූ ඥාති රැකවරණයන් යටතේ සිටින දරුවන් ගේ ආරක්ෂාව හා සුභසාධනය පිලිබඳව නොදැනෙන, නොගැහෙන අයුරින් සොයා බැලීම සිදු කර ආරක්ෂාව හා සුභසාධනය තහවුරු කිරීම පිනිසත්, එමගින් හඳුනාගනු ලබන අවදානම් සහගත තත්ත්වයට පත්විය හැකි ස්ථානයන් අධීක්ෂණය කිරීම පිනිසත් යාන්ත්‍රණයක් ඇති කිරීම.

6.3.13 අවශ්‍ය වූ විට දරුවන්ගේ සහ දෙමාපියන්/ භාරකරුවන් ගේ මානසික හා චිත්තාවේග අවශ්‍යතා සඳහා සහය වීමට ගුණාත්මක ප්‍රජාපාදක උපදේශන සේවාවන් හෝ කෙටි කාලීන විවේක සත්කාර ඇති බවට තහවුරු වීම.

6.3.14 දරුවකුහට ඥාතියකු නොවන අය විසින් හෝ දරුවාට නුහුරු ඥාතීන් විසින් හෝ දරුවාගේ සුපුරුදු වාසස්ථානයට දුරස්ථව සිටින ඥාතින් විසින් ලබා දෙන අවිධිමත් රැකවරණයන් ලබන දරුවන්, අපයෝජනයෙන්, නොසලකා හැරීමෙන්, ළමා ශ්‍රමිකත්වයෙන් සහ සූරා කෑමෙන් ආරක්ෂා කෙරෙන බව තහවුරු කිරීමටත්, සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකු ගේ වෛද්‍ය පරීක්ෂාවකින් සහ ඖෂධ වට්ටෝරුවකින් තොරව ඖෂධ සහ ප්‍රතිකාර ලබා දීමෙන් ආරක්ෂා කර ගැනීමටත්, දරුවාට ඇති ගැටලුකාරී යමෙක් වේ නම් එය රහසිගත ව දැනුම්

දීම සඳහා නිපුණත්වයකින් යුත් විශ්වාසකටයුතු පුද්ගලයකු ඇති බවට තහවුරු කිරීමත් සඳහා යාන්ත්‍රණයන් ඇති කිරීම.

6.3.15 ශාරීරික හා මානසික ආබාධ සහිත දරුවන් ඇතුළුව විකල්ප රැකවරණ ක්‍රමය තුල සිටින සියලු දරුවන්හට අධ්‍යාපනය සඳහා අවකාශය ඇති බවට මෙන් ම එම දරුවන් සමාජගත කිරීම ඉලක්ක කර ගනිමින්, ආබාධිත තත්ත්වයන් පිලිබඳ ජාතික ප්‍රතිපත්ති වලට අනුකූල ව උපදේශනය, කථන, වෘත්තීය හා ශාරීරික චිකිත්සාවන් ද ඇතුළුව පරිපූර්ණ රැකවරණයක් සැපයෙන බවටත් තහවුරු වීම.

6.3.16 දරුවකුහට ස්ථිර රැකවරණයක් සැලසීමට පෙර සුදුසු පුද්ගලයකු ගේ රැකවරණය, පෝෂිත රැකවරණය වැනි තාවකාලික රැකවරණයක් සැපයීමට සිදු වූ අවස්ථාවන් හිදී එම තාවකාලික රැකවරණය සැපයීම හැකි අවම කාල සීමාවකට වන බවට තහවුරු කිරීම.

6.3.17 ළමා මවුවරුන්හට, තනි මවුවරුන් හා ඔවුන් ගේ දරුවන්හට සලසන සහයන් කෙරෙහි වැඩි අවධානයක්, ඔවුන් දෙමාපිය විවාහයකින් තොර ව උපන්නේ ද යන්න සැලකීමට ලක් කිරීමෙන් තොරව යොමු කිරීම හා ඔවුන් සමාජ අපහාසයට ලක් කිරීම අඩු කිරීම සඳහා ප්‍රයත්න දැරීම; ඔවුන් හට තම පවුල් සංස්ථාව සමග ම ජීවත් වීමට ඉඩ සලසා දීම සඳහා ගතහැකි සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ සියලු ළමා ගැබිනි මව්වරුන්හට අධ්‍යාපනය අඛණ්ඩව සිදු කිරීම ඇතුළුව, ළමා මවුවරුන්හට ළමා හා මාපිය යන අයිතිවාසිකම් දෙවර්ගයම සහිතවීම තහවුරු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

6.3.18 විකල්ප රැකවරණ සැලසුම් යටතේ සිටින නවයොවුන් දරුවන්, වැඩිහිටියන් ලෙස වගකීම් ඉටු කිරීමට සූදානම් කිරීම සඳහා අපයෝජනයේ ගැටලු, ප්‍රජනක සෞඛ්‍ය සහ ලිංගික ව සම්ප්‍රේශණය වන රෝග පිලිබඳ අධ්‍යාපනික වැඩසටහන් මගින් සවිබල ගැන්වීම දිරිමත් කිරීම.

6.3.19 සහෝදර සහෝදරියන් හැකි තාක් දුරට එක් ස්ථානයක රැඳවීම සිදුවන බව තහවුරු කිරීම. මෙම යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග යෝජනා කෙරේ. විනිසුරුවරුන් දැනුවත් කිරීම, විවිධ රැකවරණ ආයතනයන් හී/රැකවරණ ක්‍රමයන්හි සිටින සහෝදර සහෝදරියන් අතර සම්බන්ධතාවය පවත්වා ගැනීමට පහසුකම් සැලැස්වීම, ගැහැණු සහ පිරිමි දෙපිරිසේ ම සහෝදර සහෝදරියන් එකට රැඳවීම සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, උපරිම යහපත සඳහා නොවන්නේ නම් සහෝදර සහෝදරියන් එකට තැබීම සඳහා නව නීති හඳුන්වා දීම.

6.3.20 විකල්ප රැකවරණ ක්‍රමය තුල සිටින දරුවන් පිලිබඳ ව, ළමා රැකවරණ මධ්‍යස්ථානයන් හී රැකබලා ගන්නන් ගේ ධාරිතා සංවර්ධනයන් සිදු කිරීම.

## 6.4 නිතිය සමග සම්බන්ධ වූ දරුවන් හා නීතිය සමග ගැටුම් ඇති කරගත් දරුවන්

මෙම කොටස වයස අවුරුදු 18ට අඩු, නීතිය සමග සම්බන්ධ වූ දරුවන් හා නීතිය සමග ගැටුම් ඇති කර ගත් සියලු දරුවන් ගේ ආරක්ෂාව තහවුරු කිරීම හා සම්බන්ධ වේ. දරුවකු රැඳවා තැබීමට මෙන්ම දරුවා ගේ නිදසහ අභිමි කිරිමට විකල්පයන් වශයෙන්, පවුල් - හා - ප්‍රජා පාදක සේවා (පුනරුත්තාපනය ද ඇතුළුව) සලකා බැලීම සහ දරුවකු ගේ අයිතීන් හා නිදහස සුරක්ෂිත කිරීම මෙයට අයත්වේ. දරුවන් අධිකරණ පද්ධතිය සමග අනවශ්‍ය ලෙස සම්බන්ධ වීම වැලැක්වීම සඳහා වෙනත් ක්‍රමවේදයක් ඇති කිරීම මෙමගින් සලකා බැලේ.

6.4.1 ළමා අධිකරණ ආරක්ෂාව පිලිබඳ පනත් කෙටුම්පත සහ බාලක යුක්තිය පිලිබඳ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම කඩිනම් කිරීම.

6.4.2 අපරාධ අධිකරණ ක්‍රමයෙන් වෙනස් වූ ක්‍රමයක් දරුවන් වෙනුවෙන් සන්තතික ව භාවිතා කිරීමට සහය වීම සඳහා, ළමා හා යෞවනයන් පිලිබඳ ආඥා පනතෙහි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහ පනතේ 114 වැනි වගන්තියෙහි, සහ 1988 අංක 72 දරණ සමථ මණ්ඩල පනතෙහි වූ විකල්ප දණ්ඩනයන් උපයෝගී කර ගනිමින් විශේෂිත මාර්ගෝපදේශ සකස් කිරීම.

6.4.3 සමථ මණ්ඩල කාර්යභාරය, දරුවන් විශේෂයෙන් ම සුළු සොරකම්, කට්ටි පැනීම්, සුළු වරදකට චෝදනා ලැබීම වැනි, භාවිතයේ යෙදවිය හැකි සියලු අවස්ථාවන් සඳහා නැවත හඳුන්වා දීම.

6.4.4 වසර 3ක් හෝ වැඩි කාලයක් සඳහා රැඳවුම් නිවාසගත කිරීම හෝ සහතික කල පාසැල්ගත කිරීම වෙනුවට, පරිවාස නියෝගයක් හරහා ප්‍රජාපාදක පුනරුත්තාපනය ලබා දීම සඳහා, වරදකරුවන් පරිවාස භාරයේ තැබීම පිලිබඳ ආඥා පනත භාවිතා කිරීම දිරි ගැන්වීම.

6.4.5 අධිකරණ ක්‍රමය තුල සිටින දරුවන් ගේ ප්‍රගමනය පිලිබඳ විමසිලිමත් වීම සඳහාත් ඔවුන් අධීක්ෂණය කිරීම සඳහාත්, දත්ත පද්ධති හා දත්ත කලමනාකරණ ක්‍රම භාවිතය ප්‍රවර්ධනය කිරීම.

6.4.6 ද්වාර පාලන ක්‍රියාවලියත් අධිකරණ පද්ධතිය දක්වා ව්‍යාප්ත කිරීම සහ නීතිය සමග සම්බන්ධ වූ දරුවන්ට අදාලව සිදු කෙරෙන ඇගයීම, ආරක්ෂණ සැලසුම් සකස් කිරීම, පවුල් සහයන් සැලසීම හා සමාලෝචන කිරීම තවදුරටත් ශක්තිමත් කිරීම.

6.4.7 නීතිය සමග ගැටුම් ඇති කර ගත් දරුවකුහට සුදුසු ස්ථානගත කිරීම පිලිබඳව ඇගයීම් සිදු කිරීම සඳහා බාලක ඇගයීම් මණ්ඩලයක් පිහිටු වීම.

6.4.8 දරුවන් තවදුරටත් ක්ෂතියට ලක් වීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා, දරුවා මුහුණ දුන් සිදුවීම විවිධ පුද්ගලයින් ඉදිරියේ නැවත නැවතත් පැවසීමට සිදු වීම වැලැක්වීම සඳහා පවතින ක්‍රමයන් සවිමත් කිරීම.

6.4.9 තම නිවසේ දී වින්දිතභාවයට පත් දරුවන් සඳහා ප්‍රතිසංස්කරණයන් ඇරඹීම සහ දරුවා ගේ ආරක්ෂාව මෙන්ම චිත්තාවේග යහපැවැත්ම සහතික විය හැකි නම්, නිවසේ දී වින්දිතභාවයට පත් දරුවන්හට සුපුරුදු වටපිටාවේම වාසය කිරීමට ඉඩ සැලස්වනු පිනිස, තම නිවසේම හෝ එසේ නොමැති නම් ඥාති නිවසක වාසය කිරීමට හැකි උපරිමයෙන් ඉඩකඩ සලසා දීම.

6.4.10 වින්දිතයා වාසය කරනු ලබන පරිසරයේ ම අපයෝජකයා ගේ වාසය සිදු නොවීම සඳහා, අපරාධකරු ඉන් ඉවත් කිරීමටත්, අනිවාර්යෙන් නඩු පැවරීමටත් උද්දේශනයන් සිදු කිරීම සහ අපරාධකරු පවුලේ එකම ආදායම් උපයන්නා නම් පවුලට මූල්‍යමය සහ රැකියාමය සහයයන් සැලසීමටත් උද්දේශනයන් සිදු කිරීම.

6.4.11 දරුවකු ආයතනගත කිරීම අවසාන විකල්පයක් විය යුතුය යන සංකල්පය ප්‍රවර්ධනය කිරීමටත්, දරුවන් වෙනුවෙන් විධිමත් අධිකරණ ක්‍රියාවලියෙන් පරිභාහිර ක්‍රමවේදයක් දිරිගැන්වීමට හා ප්‍රමුඛතාගත කිරීමටත්, අධිකරණ සේවා කොමිෂන් සභාව සමග උද්දේශනය කිරීම.

6.4.12 බාලක යුක්තිය පසඳලීමේ ක්‍රියාවලියට ඇතුලත් වන දරුවන්ට අදාල නඩු තුන් මසකට වරක් සමාලෝචනය කෙරෙන බවට සහතික වීම සහ එම දරුවන්හට විශේෂිත වූ රැකවරණ සැලසීම සඳහා සහතික කල පාසැල්, රැඳවුම් නිවාස හා නිවර්තන නිවාසයන්, අඩු දරුවන් සංඛ්‍යාවක් සහිත, පාලනයට පහසු පවුලක් වැනි කුඩා ඒකකයන්ට බෙදා වෙන් කිරීම.

6.4.13 නීතිය සමග ගැටුම් ඇති කර ගත් දරුවන් සඳහා සහ ප්‍රජා පාදක පුනරුත්තාපනය සඳහා සුදුසුකම් නො ලද දරුවන් සඳහා වූ දඬුවම් නියම කිරීමේ ක්‍රියාපටිපාටිය හා පුනරුත්තාපන සේවාවන් සංශෝධනය කිරීම සහ, දඬුවම් නියම කිරීමේ දී ආයතනගත විශෝධන සේවා සඳහා යොමු කිරීම හැකිතාක් දුරට අවම කිරීම සහ, වරදකරුවන් වූ සියලු දරුවන් පිලිබඳ සිද්ධි සෑම කාර්තුවක ම සමාලෝචනය කිරීම සඳහා යාන්ත්‍රණ ඇති කිරීම.

6.4.14 නීතිය සමග සම්බන්ධ වූ සියලු දරුවන් හට ප්‍රමාණවත් සම්පත් සැපයෙන බවටත්, එම දරුවන් වින්දිතයින් බවට හෝ නැවත වින්දිතයින් බවට පත් වීමේ අවදානම් සහගත බවින් ආරක්ෂා කෙරෙන බවටත් තහවුරු වීම.

6.4.15 දරුවන් ගේ කැමැත්තට පටහැනිව ඔවුන් පවුලෙන් වෙන් කිරීමේ ක්‍රමවේදය, නිසි බලධාරියකු විසින් අදාල නීති හා ක්‍රියාපටිපාටිවලට අනුකූල ව සහ අධිකරණ සමාලෝචනයක් යටතේ සිදු කෙරෙන බවට තහවුරු වීම.

6.4.16 නීතිය සමග සම්බන්ධ වූ දරුවන් හට හොඳ ම රැකවරණ විකල්පය සැපයීම පිනිස අධිකරණයට, පරිවාස නිලධාරීන්හට, සිද්ධි කලමනාකරුවන්, රාජ්‍ය ආයතනයන් හී නිලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන බලධරයින් හට, සිද්ධි කලමණාකරණ ක්‍රමවේදය අනුගමනය කරමින් බහු විෂය කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම සඳහා හැකියාව ඇති කිරීම.

6.4.17 සෑම පලාතක ම ළමා මහේස්ත්‍රාත් අධිකරණ පිහිටුවීම ආරම්භ කිරීම හා ළමා නඩු විභාග අවසන් කිරීම සඳහා ගනු ලබන කාලය කෙටි කිරිම සහ දරුවන්ට අදාල නඩු විභාග කිරීමේ දී පවතින අධිකරණ තුල ළමා මිතුරු පරිසරයක් ඇති කිරීම.

6.4.18 පවුලක වැනි නේවාසික රැකවරණය තාවකාලික ව ලබාදීම අවශ්‍ය වන වින්දිතයින් බවට පත් දරුවන්, ළමා වරදකරුවන් වූ දරුවන් සමග එක ම ස්ථානයක රඳවා නොතබා, වෙන් වෙන් ව රඳවා තැබෙන බවට තහවුරු වීම.

6.4.19 අධිකරණ නියෝගය බලාපොරොත්තුවෙන් සිටින හෝ අධිකරණ නියෝගයක් දී ඇති හෝ දරුවකුගේ ගෞරවය හා ආත්ම අභිමානය ආරක්ෂා කෙරෙන බව, එම දරුවා රැකවරණ සැපයීම පිනිස

ආරක්ෂිත නිවාසයක් වෙත, සංක්‍රාන්තික රැකවරණයකට හෝ පවුලක වැනි රැකවරණය සපයන ප්‍රමාණයෙන් කුඩා වෙනත් නේවාසික රැකවරණයකට මාරු කර යැවීම සිදු කිරීමේ දී, අත් අඩංගුවට ගත් මොහොතේ සිට නිල ඇඳුමින් සැරසී නොගත් පිරිස් විසින් සුමටව හා කඩිනමින් කිරීම තුලින් තහවුරු කිරීම.

6.4.20 දරුවකු නැවත නැවතත් වින්දිතභාවයට පත් වීමෙන් ආරක්ෂා කිරීම පිනිස, නඩු විභාග කෙරෙන තෙක් එම දරුවන් රාත්‍රිය ගත කිරීම සඳහා පොලිස් ස්ථානයක, බාලක නිරීක්ෂණ මධ්‍යස්ථානයක හෝ වැඩිහිටි රැඳවුමක තාවකාලිකව හෝ රැඳවා තැබීමෙන් වැලකී, යාබද ව පිහිටි රජයේ ළදරු රෝහල් ඒකකයක හෝ ආරක්ෂිත ස්ථානයක රඳවා තැබීම.

6.4.21 දරුවන් අධිකරණය වෙත රැගෙන ඒම හා ඉන් පිටතට රැගෙන යෑම සඳහා ළමා මිතුරු ප්‍රවාහන පහසුකම් දරුවන් හට සැපයෙන බවට තහවුරු වීම.

6.4.22 හැකි අවස්ථාවන් හි දී පැය 24 පුරා විවෘත කර තැබිය හැකි අංග සම්පූර්ණ තාවකාලික සංක්‍රාන්ති ආරක්ෂිත නිවාස පලාත් නවයෙහි ම අදාල අධිකරණය අසල පිහිටුවීම.

6.4.23 බන්ධනාගාරය තුලදී උපත ලැබීම හේතුවෙන් හෝ, සිරගත වීම හේතුවෙන් මව විසින් රැගෙන පැමිණි හෝ, සිරකාරියක ගේ වයස අවුරුදු 5ට අඩු දරුවකු වාසය කරන ස්ථානය තීරණය කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසීම සහ දරුවා මව සමග නවතින්නේ නම් දරුවන් රැක බලා ගැනීමේ සේවාවන් හා පහසුකම්, ළමා මිතුරු පරිසරයක දරුවා ගේ උපරිම යහපත සලකා බලමින් සපයා දෙන බව තහවුරු කිරීම.

## 6.5 දරුවන් පවුල් සංස්ථාව සමග යලි එක් කිරීම හා සමාජගත කිරීම.

මෙම කොටස, ආරක්ෂාව තහවුරු කිරීම සඳහා තම පවුල් සංස්ථාවෙන් වෙන් කල දරුවන් සම්බන්ධයෙන් අවධානය යොමු කරන අතර, ඔවුන් පවුල සමග එක් කිරීම හා සමාජගත කිරීම හැකි ඉක්මනින් සිදු කිරීම පළමු ඉලක්කය වශයෙන් සැලකීමේ මූලධර්මය මත පිහිටා සිටී. පවුල සමග යලි එක් කිරීමේ ක්‍රියාවලිය, දරුවා ගේ උපරිම යහපත සැලසීමේ මූලධර්මය මත පිහිටමින් සිදුවිය යුතු වූවකි; එය දරුවකු නිවසින් පිටත වූ තාවකාලික රැකවරණයක සිට මුල් පවුල වෙත යලි යැවීමේ ක්‍රියාවලියයි.

6.5.1 පවුල සමග යලි එක් කල/සමාජගත කල දරුවන් හා සම්බන්ධ දත්ත ගබඩාවක් නඩත්තු කිරීම සහ විකල්ප රැකවරණයන් ගෙන් පිටව ගිය සියලු දරුවන් ගේ ප්‍රගතිය වාර්ෂික ව සමාලෝචන කිරීම.

6.5.2 විකල්ප රැකවරණයකට දරුවකු ලක් කල මොහොතේ සිටම එම දරුවා නැවත පවුල සමග එක් කිරීම ක්‍රමාණුකූල ව සැලසුම් කල යුතු අතර එම සැලසුම් කිරීමට, දරුවා විකල්ප රැකවරණයට ලක් කිරීම කඩිනම් කිරීමට අදාල වූ ගැටලු, පවුල් ඉතිහාසය, සම්බන්ධතාවයන්, දෙමාපියන් ගේ සෞඛ්‍ය තත්ත්වය හා චිත්තාවේග ක්‍රියාකාරීත්වය සහ ප්‍රජා පරිසරයේ උචිත බව යනාදිය පිලිබඳ ව පූර්ණ ඇගැයීමක් සිදු කිරීම ද ඇතුලත් විය යුතුය. පවුල සමග යලි එක් කිරීම/ සමාජගත කිරීම සඳහා ආරක්ෂණ සැලසුමක් සකස් කල යුතු අතර එහි එක් එක් දරුවාට අදාල ව එක් එක් පාර්ශවයේ/ නිලධාරීන් ගේ වගකීම් ඇතුලත් විය යුතුය.

6.5.3 ආයතනගතව සිටින දරුවන් පවුල් පරිසරයට හා සමාජයට හැඩ ගැසීමේ ගැටලු අඩු කිරීම සඳහා ඔවුන් ප්‍රමාණවත් ලෙස සමාජයට හුරු කිරීම හා සමාජය හා ප්‍රජාව සමග අන්තර් සම්බන්ධතා පැවැත්වීම ඉඩප්‍රස්ථාව ඇති බවට තහවුරු වීම.

6.5.4 දරුවා පවුල සමග නැවත එක් කිරීමට පෙර දරුවා ගේ නිවසෙහි ඒ සඳහා සූදානම හා ගෙන ඇති ආරක්ෂක පියවරයන් ඇගයීමේ ක්‍රියාවලිය හා නිවෙස්-පිරික්සීමේ මාර්ගෝපදේශයන් ශක්තිමත් කිරීම. පවුල සමග නැවත එක් කිරීමෙන් පසු එහි පැවැත්ම ඇගයීමටත් විනිවිදභාවයකින් යුතුව තීරණ ගැනීමටත් ඉහත ඇගයීම්වලට යාවත්කාලීන තොරතුරු ඇතුලත් කිරීම.

6.5.5 හැකි යැයි හැගෙන සෑම අවස්ථාවක ම සැලසුම් කිරීමේ දී, සේවාවන් තෝරා ගැනීමේ දී හා ප්‍රගතිය ඇගයීමේ දී දරුවා ගේ පවුල ඒ සඳහා ඇතුලත් කර ගැනීමට හා සහභාගී කර ගැනීමට පියවර ගැනීම හා විකල්ප රැකවරණ සපයන්නන් විසින් බහු-විෂය කණ්ඩායමක උපදෙස් ගනිමින්, සිද්ධි සටහන්, ඇගයීම් හා දරුවා, පවුල සහ රැකවරණ සපයන්නන් ගේ අදහස් සලකා බලමින්, දරුවන් නැවත පවුල සමග එක් කිරීම සඳහා අඛණ්ඩ සූදානම් කෙරෙන බවට තහවුරු කිරීම.

6.5.6 නැවත පවුල සමග එක් කිරීමේ ක්‍රියාවලියේ දී, දරුවා ගේ හා පවුලේ සංකීර්ණ අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමට, යෝග්‍ය චිකිත්සක සේවාවන්, ආර්ථික සුභසාධනයන් සහ/හෝ විකල්ප රැකවරණයට පාදක වූ පවුලේ අවශ්‍යතා හා දරුවා ගේ උපරිම යහපත පිලිබිඹු කෙරෙන විවිධාකාර වූ

හේතු සඳහා ආමන්ත්‍රණය කිරීම් ද ඇතුළුව, උචිත සේවාවන් හා සහයයන් සැපයීම.

6.5.7 සමාජගත කිරීම සඳහා සූදානම් අනාථ දරුවන් ගේ ඉඩම් හා නිවාස වැනි විශේෂ අවශ්‍යතා සලකා බැලීම හා තහවුරු කිරීම.

6.5.8 පවුල සමග එක් වීමට කැමති හා අත්හල දරුවන් හට පවුල් සොයා ගැනීමට හා පවුල සමග එක් කිරීමට පහසුකම් සැපයීම.

6.5.9 සමාජගත කරමින් සිටින දරුවන් හට සහය වීම සඳහා ප්‍රජාවට දැනුවත්බව ලබා දීම හා සවිබල ගැන්වීම තහවුරු කිරීම.

6.5.10 සංක්‍රාන්ති ක්‍රියාදාමයට දරුවකු හට හැඩගැසීමට ඔහු/ඇයගේ වර්ධන වයස, වෛද්‍ය ඉතිහාසය, විශේෂ අවශ්‍යතා, ආරක්ෂාව, මතුවී එන හැකියාවන් ආදිය සැලකිල්ලට ගනිමින්, සමාජගත කිරීමේ ක්‍රියාවලියේ දී හා ඉන් පසුව නිරතුරු ව අධීක්ෂණය කිරීම සහ පසු විපරම් යාන්ත්‍රණයන් මගින් රැකවරණ සපයන්නන් හට සංක්‍රාණ්තියට පහසුකම් සැලසීම්

6.5.11 මත්ද්‍රව්‍ය හා මත්පැන් ඇබ්බැහිය පිළිබඳ ඉතිහාසයක් සහිත දරුවන් සමාජගත කිරීම, බාහිර රෝගී පුනරුත්ථාපනයන් හා පසු විපරම් සේවාවන් ලබා දෙමින් පහසු කරවීම.

6.5.12 වයස අවුරුදු 18 සම්පූර්ණ වන දරුවන් ආයතනික රැකවරණයෙන් පිට ව යෑම සඳහා සූදානම් කිරීම, පසු-රැකබලා ගැනීමේ සැලසුම්, සමවයස් කණ්ඩායම් ජාලයන් වෙත ප්‍රවේශය සහ අධ්‍යාපනය හා වෘත්තීය පුහුණුව, නිවාස, රැකියාවන් හී පිහිටුවීම සහ මනෝවෛද්‍යමය, නෛතික හා සෞඛ්‍ය සේවාවන් ඇතුළුව අතිරේක සහයයන් ලබා ගැනීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන් හී රැකවරණ සපයන්නන් හා සේවා සපයන්නන් වෙත ප්‍රවේශයන් සහිත ව, සමාජගත කෙරෙන කාල සීමාව තුල උචිත මූල්‍යමය හා චිත්තාවේග සහයයන් සහ ආබාධ සහිත වූවන් හට විශේෂ සේවාවන් ද සහිත ව කෙරෙන බවට තහවුරු වීම.

## 6.6 නීති ප්‍රතිසංස්කරණයන්, ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් සහ අවම ප්‍රමිතීන්

ඉහළ ම ගුණාත්මයෙන් යුත් විකල්ප රැකවරණ සේවාවක් සහ විකල්ප රැකවරණ සපයන්නන් සහතික කරනු පිනිස කාර්ය මණ්ඩල බඳවා ගැනීම, පුහුණු කිරීම සහ සම්පත් ලබා දීම ඇතුළුව සේවා ප්‍රමිතීන් සකස් කිරීම සඳහා නිර්ණායක හා අවම ප්‍රමිතීන් ගොඩ නැගීමට සකස් කල යුතු හා ස්ථාපනය කල යුතු නීති ප්‍රතිසංස්කරණ, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ අවම ප්‍රමිතීන් මෙම කොටසින් දක්වනු ලබයි.

6.6.1 විකල්ප රැකවරණ ස්ථානයන් ඇගයීම, අධීක්ෂණය කිරීම හා පසු විපරම් කිරීම සිදු කෙරෙන බවට හා සෑම විට ම බහු-විෂය ප්‍රවේශයක් අනුගමනය කෙරෙන බවට තහවුරු වීම සඳහා මාර්ගෝපදේශයන් ගොඩ නැගීම.

6.6.2 විකල්ප රැකවරණ සැලසුම් විධිමත් අධීක්ෂණයට ලක් කිරීම පිනිස හා සියලු විකල්ප රැකවරණ ස්ථානයන්හී ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීම පිනිස මාර්ගෝපදේශ සහ අධීක්ෂණ ප්‍රමිතීන් සමාලෝචනය කිරීම, සංශෝධනය කිරීම හා සැකසීම සහ එම කටයුත්ත සඳහා ප්‍රමාණවත් ලෙස සම්පත් වෙන් කිරීම.

6.6.3 විකල්ප රැකවරණ ප්‍රතිපත්තිවලට අදාල ව පවතින සියලු නීති, අවම ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශයන් සමාලෝචයනය කර මෙම ප්‍රතිපත්ති ලේඛණය හා තුලනය කිරීම සහ අවශ්‍ය තැන් හී දී, විශේෂයෙන් විවිධ විකල්ප රැකවරණ ක්‍රම සඳහා ඉඩ සැලසීමට, නව ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ ගොඩනැගීම.

6.6.4 තම දරුවාහට නිවසින් පිටත රැකවරණ සැලසීමට බලාපොරොත්තු වන දෙමාපියන් සමග ප්‍රථමයෙන් ම සම්බන්ධවන කාර්ය මණ්ඩලයන් හී සියල්ලන් සඳහා ප්‍රමාණවත් පුහුණු කිරීම් හා සහයයන් ලබා දීම සඳහා මානව හා මූල්‍ය සම්පත් වෙන් කිරීම අධීක්ෂණය කිරීම සඳහා මාර්ගෝපදේශ ගොඩ නැගීම.

6.6.5 ළමාරක්ෂක කටයුතු හා සම්බන්ධ ආචාර ධර්ම සහ යහ පරිචයන් පිලිබඳ මාර්ගෝපදේශ ගොඩ නැගීම.

6.6.6 දරුවන් හට රැකවරණය සපයන ආයතනයන් හී සේවාස්ථ පිරිස් හට රාජ්‍ය ප්‍රතීතනය සහිත පුහුණු වැඩසටහනක් සකස් කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

6.6.7 සමාජ සේවකයා/ ළමාරක්ෂණ කටයුතු, වත්මන් රාජ්‍ය සේවයේ වෘත්තීයමය කාණ්ඩයේ සේවක සනයක් වශයෙන් පිලිගැනීම සඳහා ප්‍රායෝගික ප්‍රතිපත්ති විසඳුම් යෝජනා කිරීම හා සකස් කිරීම.

6.6.8 අදාල සියලු පාර්ශවයන් ගේ පුද්ගලිකත්වය හා රහස්‍යබව ආරක්ෂා කිරීමේ විධිවිධාන ද ඇතුලත් ව, දරුවන් පිලිබඳ දත්ත පද්ධති නඩත්තු කිරීම සඳහා මාර්ගෝපදේශ හා ප්‍රමිතීන් ගොඩ නැගීම.

6.6.9 දරුවන් සඳහා රැකවරණය සපයන ආයතනයන් හට ඔවුන් ගේ සේවය ප්‍රශස්ත කිරීම පිනිස

ඔවුනොවුන් අතර තොරතුරු හුවමාරුව හා ජාලගතවීමට උපකාරී වන ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම සඳහා මාර්ගෝපදේශ හා ප්‍රමිතීන් ගොඩ නැගීම සහ එසේ ජාලගත වීම දරුවා ගේ පුද්ගලිකත්වය හා රහස්‍යබව ආරක්ෂා කෙරෙමින් සිදුවන බවට තහවුරු වීම.

6.6.10 විකල්ප රැකවරණ සපයන සියලු ආයතනයන්, ළමා රැකවරණයන්ට අදාල බලපත්‍ර රෙගුලාසි පිළිපදින බවටත්, දරුවන් ගේ විනය පාලනය කිරීම සඳහා නීතියෙන් තහනම් ක්‍රම වලට දරුවකු යටත් කිරීමට ඉඩ නොතබන බවටත්, වෙනතකට යොමු කිරීම හා ධනාත්මක බලගැන්වීම අරමුණු කොටගත් ප්‍රමිතිගත ක්‍රමවේද අනුගමනය කරන බවටත් තහවුරු වනු පිනිස මාර්ගෝපදේශ සකස් කිරීම.

6.6.11 විකල්ප රැකවරණයන් හී සිටින දරුවන් හමුවීමට පැමිණෙන ත්‍යාගශීලීන් හා ස්වේච්ඡා සේවකයින් ඇතුලු සියලු වැඩිහිටියන්, දරුවන් හමු වීමට පෙර හඳුනා ගැනීමේ දැඩි පිරික්සුමකට ලක් කෙරෙන බව තහවුරු කිරීම සඳහා  මාර්ගෝපදේශ සකස් කිරීම.

6.6.12 අවදානම් තත්ත්ව යටතේ සිටින දරුවන් සඳහා ආධාර ලබා දෙන සියලු ප්‍රභවයන් පිලිබඳ ව, නිතිපතා නිසි වේලාවන්හි විගණනයන් සිදු  කිරීම හා විකල්ප රැකවරණ සපයන්නන් ප්‍රමාණවත් විමර්ශණ හා සුරක්ෂිතා පිරික්සුම් වලට ලක් වන බව තහවුරු කිරීම.

6.6.13 සියලු නේවාසික රැකවරණයන් හී සිටින දරුවන් ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ශක්තිමත් ආරක්ෂක ක්‍රමවේදයක් ඇති කිරීම.

6.6.14 බුද්ධිමය හා ශාරීරික ආබාධ සහිත දරුවන් හට, ඒඩ්ස් සහ අනෙකුත් බෝවන රෝග සහිත දරුවන් හට නිවැරදි ව ප්‍රතිචාර දැක්වීම සඳහා මෙන්ම හදිසි අවස්ථාවන් හිදී නිවැරදි ව ප්‍රතිචාර දැක්වීම සඳහා විකල්ප රැකවරණ සපයන සියලු පිරිස් සූදානම් කිරීම හා පුහුණු කිරීම.

6.6.15 දරුවා ගේ ආරක්ෂාවට ගැටළුවක් නොවන්නේ නම් නේවාසික රැකවරණය සපයන විකල්ප රැකවරණයන්, දරුවා ගේ ප්‍රජාවට සමීපව පිහිටීම වඩාත් යෝග්‍ය වන අතර, එම ස්ථාන ප්‍රමාණයෙන් කුඩා සහ දරුවකු ගේ උපරිම යහපත සැලසීම පිනිස වන බවට තහවුරු වීම.


Education
Family
Justice
Social Services
Non - government Organizations
Community Structures
Probation
Police
Health

# ආයතනික රාමුව, අධීක්ෂණ හා සමාලෝචන ක්‍රමවේදය

මෙම ලියවිල්ලෙහි වූ ප්‍රතිපත්ති මගපෙන්වීම් යථාර්ථයක් බවට පත් කිරීම සඳහා, මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමට හා සමාලෝචනය කිරීමට ආයතනික රාමුවක් ඇති කිරීම අවශ්‍ය වනු ඇත. මෙම ප්‍රතිපත්ති මගපෙන්වීම්, නීති හා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් ගේ සිට විශේෂිත මැදිහත්කරණයන් දක්වා විහිදී ඇති බැවින්, අධීක්ෂණය කිරීමේ හා සමාලෝචනය කිරීමේ වගකීම දරන ආයතනය විසින් ඒ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු වනු ඇත. මෙම ක්‍රියාකාරී සැලැස්මට කාල නිර්ණයන්, වගකීම් බෙදීම, මූල්‍ය හා මානව සම්පත් සහ අධීක්ෂණ සැලසුමක් ඇතුලත් විය යුතුය.

මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම සඳහා කාර්යසාධක බලකායක් හෝ ඊට සමාන වූ ඉහල බලයක් සහිත ආයතනයක් පිහිටවිය යුතු බවට නිර්දේශ කෙරේ. ක්‍රියාකාරී සැලැස්ම ඵලදායී අයුරින් ක්‍රියාවට නැංවෙන බව තහවුරු කර ගැනීම සඳහා එම කාර්යසාධක බලකාය බල ගැන්විය යුතු අතර ප්‍රමාණවත් ලෙස සම්පත් ලබා දිය යුතුය. පහත සඳහන් වන්නන් කාර්යසාධක බලකායට ඇතුලත් විය යුතු බවට නිර්දේශ කෙරේ:

1. පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තු කොමසාරිස්වරයා
2. ජාතික ළමාරක්ෂක අධිකාරියෙහි සභාපතිවරයා
3. නීතිය හා සාමය පිලිබඳ අමාත්‍යාංශයහි සාමාජිකයෙක්
4. කාන්තා හා ළමා කටයුතු පිලිබඳ අමාත්‍යාංශයහි සාමාජිකයෙක්
5. ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරියෙක්
6. පලාත් පරිවාස හා ළමා රක්ෂක සේවා කොමසාරිස්වරුන්
7. රාජ්‍ය නොවන ළමා අයිතිවාසිකම්/ළමාරක්ෂක සේවාවන් හී නියෝජිතයින් තිදෙනෙක්
8. ළමා අයිතිවාසිකම්/ළමාරක්ෂක සේවාවන් පිලිබඳ පසුබිමක් සහිත නීතිඥවරයෙක්

## 7.1 කාර්යසාධක බලකායේ වගකීම්

- විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම.
- විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකාරී සැලැස්ම මගින් හඳුනා ගනු ලැබූ ආකාරයට, අදාල ප්‍රතිපත්ති, නීති, මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් හඳුනා ගැනීම, සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම.
- ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සම්පත් ලබා ගැනීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් සමගින් ඉල්ලීම් ඉදිරිපත් කිරීම.
- විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය පිලිබඳව පලාත් හා ජාතික මට්ටමින් උද්දේශන සිදු කිරීම.
- නිශ්චිත කාලාන්තරයකට වරක් විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර සුදුසු පරිදි සංශෝධනයන් සිදු කිරීම.

# පාරිභාෂික යෙදුම්

- **උද්දේශනය** - යමෙකු ආරක්ෂා කිරීම පිනිස හෝ ඔවුන් ගේ කාරණාව ඉදිරියට ගෙන යාම පිනිස අදාල පුද්ගලයින් ඍජුව ම නියෝජනය කිරීමේ හෝ ආරක්ෂා කිරීමේ ක්‍රියාවයි.

- **ඇගයීම** - තොරතුරු එක් රැස් කිරීම සහ, සේවාලාභියා හෝ සේවාලාභි ක්‍රමවේදයකට අදාලව ඇති ගැටලු සහ ශක්තීන් සම්පව පිරික්සීමේ සහ අදාල තොරතුරු ඵලදායී මැදිහත්කරණයන් සැලසුම් කිරීම සඳහා, විධිමත් හෝ අවිධිමත් තාක්ෂණික මෙවලම් හා ශිල්පක්‍රම භාවිතා කරමින් වර්ගකර සකස් කිරීමේ ක්‍රමවේදයයි.

- **රැකවරණ සපයන්නා** - දරුවකු ගේ අවශ්‍යතා සපයා දීම සිදුකරනු ලබන නිවසක සිටින ස්වභාවික දෙමාපියන්, ඥාතීන්, සත්කාරක මාපියන් හෝ ගෘහමූලිකයකු ඇතුළුව, ආයතනගත පරිසරයක සිටින දරුවකු හට ආරක්ෂාව හා රැකවරණය සපයන පුද්ගලයකු වේ.

- **දරුවා** - එක්සත් ජාතීන් ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට ( 1වන වගන්තිය) අනුකූල ව දරුවා යනු වයස අවුරුදු 18 ට අඩු ඕනෑ ම පුද්ගලයකු වේ.

- **ළමා ආරක්ෂණය** - දරුවන්ට එරෙහි ව සිදු කෙරෙන අපයෝජනයන්, නොසලකා හැරීම්, සූරා කෑම් හා හිංසනයන් වැලැක්වීමට හා ඒවාට ප්‍රතිචාර දැක්වීම පිනිස වූ ක්‍රියාමාර්ගයන් හා ව්‍යූහයන්ය.

- **ළමා අපචාර** - රැකවරණ සපයන්නෙකු විසින්, භාරකරුවකු, දරුවකු සම්බන්ධ වගකීම දරන පුද්ගලයකු, ආයතනයක්, ක්‍රියාවලියක් විසින් සිදු කරන දරුවකුගේ සෞඛ්‍යයට, වර්ධනයට සැබවින්ම හානිදායකවන හෝ හානිදායක විය හැකි ක්‍රියාවන් හෝ පැහැර හැරීම් සහ දරුවකු අනවශ්‍ය විඳවීම්වලට නිරාවරණය කිරීම් සහ දරුවකු හට ආරක්ෂා සහිත, නීරෝගීමත් වර්ධනයක් ඔස්සේ වැඩිහිටියකු බවට පත්වීමට ඇති බාධාවන්ය.

- **සිද්ධි කලමනාකරණය** - සේවාලාභියකු වෙනුවෙන් හෝ සේවාලාභී ක්‍රමවේදයක් වෙනුවෙන් ඇගයීම් සිදු කිරීම, සැලසුම් සකස් කිරීම, අධීක්ෂණය කිරීම සහ මැදිහත්කරණ සිදු කිරීමේ, යොමු කිරීමේ හා පසු විපරම් සිදු කිරීමේ සේවාවන් සැලසීමයි.

- **සිද්ධි කලමනාකරුවා** - සේවාලාභියකු ගේ ඉලක්කයන් හා අවශ්‍යතාවයන්ට අනුරූපව, සේවාලාභියාට සපයන සේවාවන් අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම කාර්යභාරය වූ සමාජ සේවකයකු ලෙස සාමාන්‍යයෙන් අර්ථ දැක්වීම සිදු කෙරේ.

- **රහස්‍යභාවය** - වෘත්තිකයකු, සේවාලාභියකු ගේ පූර්ව කැමැත්තක් සහිත ව පමණක් ඔවුන්ට අදාල තොරතුරු පිටතට ලබා දීම හෝ වෙනත් අය සමග හුවමාරු කර ගැනීම සිදු කිරීමේ ආචාරධර්මය වේ.

- **ආයතනහරණය** - ආයතනගත කොට සිටින දරුවන්, ප්‍රජාවෙහි වූ ස්ථාන වෙත (පවුල ද ඇතුලත්ව) මුදා හැරීම සහ ඔවුන්හට පසු රැකවරණ ලබා ගැනීමට හෝ ස්වාධීන ව ජීවත් වීමට පහසුකම් සැලැස්වීමයි.

- **ද්වාර පාලනය** - දරුවන් පවුලෙන් වෙන් කිරීම වැලැක්වීමේ හා නුසුදුසු රැකවරණයන්ට යටත් කිරීමෙන් වැලැක්වීමේ අරමුණින් දරුවන් සහ ඔවුන් ගේ පවුල් නිසි සේවාවන් වෙත හෝ රැකවරණයන් වෙත යොමු කිරීමේ ක්‍රියාවලියයි.

- **දරුවන් ආයතනගත කිරීම** - දරුවකුහට හෝ මානසික රෝගී බවින් යුතු පුද්ගලයකුහට රැකවරණ සපයන්නා වූ ආයතනයන් වැන්නක රැකවරණයක මනුෂ්‍යයකු රැඳවීමයි.

## ඇමුණුම - 1

### වර්තමානයේ ශ්‍රී ලංකාවෙහි දක්නට හැකි ළමා රැකවරණයන්

**අනුමත පාසැල්** - 2013 වසර වන විට ශ්‍රී ලංකාවෙහි, අනාථ වූ, අසරණ බවට පත් වූ, අත්හල සහ අපයෝජනයට ලක් වූ දරුවන් හට සෙවන සහ මනෝවිද්‍යාත්මක හා කායික විද්‍යාත්මක ආරක්ෂාව සැපයීම සඳහා ස්ථාපනය කල අනුමත පාසැල් 2ක් විය. ශ්‍රී ලංකාවෙහි සෑම පලාතක ම සිටින දරුවන් සඳහා මනෝසාමාජීය සහය සැපයීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී. අනුමත පාසැල්වල අවශ්‍යතාවය ඇගයීමට ලක් කරමින් සුදුසු පරිදි ප්‍රතිසංස්කරණයන් සිදු කෙරෙනු ඇත.

**සහතික කල පාසැල්** - සහතික කල පාසැල් මගින් ඇතුලත් කල දරුවන් සඳහා ක්‍රමාණුකූල වෘත්තිය පුහුණුව ලබා දීම සිදු කෙරේ. ඇතුලත් කිරීමට හේතූන් වන්නේ සොරකම, දෙමාපියන්හට අකීකරුකම, මත්පැන් විකිනීම හා භාවිතා කිරීම, ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය වීම, සිය දිවි නසා ගැනීමට උත්සහ කිරිම හා වෙනත් හේතූන් ආදියයි.[1] ශ්‍රී ලංකාවෙහි බොහොමයක් සහතික කල පාසැල් ප්‍රමාණයට වඩා අධික දරුවන් සංඛ්‍යාවක්, ප්‍රමාණවත් නොවන කාර්යමණ්ඩලයක් යටතේ තබා ගනු ලබයි. මේවාද පරීක්ෂාකාරී ව ඇගයීමට ලක් කර දරුවන්ට වඩා හිතකාමී ස්ථානයන් බවට ප්‍රතිව්‍යූහගත කෙරෙනු ඇත.

**නිවර්තන නිවාස** - වයස අවුරුදු 8 ට වැඩි යාචක දරුවන්, සොරකම් කිරීම, මත්පැන් විකිණීම හා භාවිතා කිරීම, දෙමාපියන්ට අකීකරු වීම සහ වෙනත් වැරදි සඳහා දඬුවම් නියම කල දරුවන් මෙන්ම ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය දරුවන් පුනරුත්ථාපනය කිරීම හා සෙවන සැපයීම නිවර්තන නිවාස මගින් සිදු කරයි. අධික තදබදය හේතුවෙන් හා විවිධ අවශ්‍යතා සහිත දරුවන් එකට තැබීම; (ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය සමහර දරුවන් නීතිය සමග ගැටුම් ඇති කර ගත් දරුවන් සමග රඳවා තැබීම) හේතුවෙන් බොහොමයක් නිවර්තන නිවාස පවුලක වැනි ස්වභාවයක් නොගනී. නිවර්තන නිවාස පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය ඇගයීමට ලක් කිරීම හා ඒවා වඩාත් ළමා මිතුරු ස්ථානයන් බවට ප්‍රතිව්‍යූහගත කිරීම ආයතනහරණ ක්‍රියාවලියේදී අත්‍යවශ්‍ය වන අතර දරුවන් ප්‍රථමයෙන්ම මේවාට ඇතුළු කිරීම අඩු කිරීම සඳහා ප්‍රතිසංස්කරණයන් ගෙන ඒම හා සමාජ ගැටලු ආමණ්ත්‍රණය කිරීම අත්‍යවශ්‍ය වේ.

**කණ්ඩායම් නිවාස** - කණ්ඩායම් නිවාස දරුවන් 10-15 අතර සංඛ්‍යාවකට ඉඩ සලසන, තමන්ට අයත් නොවන පෞද්ගලික නිවසක, කාර්ය මණ්ඩලයේ එක් අයෙක් හෝ වැඩි සංඛ්‍යාවක් විසින් විධිමත් බවින් අඩු වූ, පවුලක වැනි රැකවරණයක් ලබා දෙන ස්ථාන වේ. සාමාන්‍යයෙන් මේවායෙහි සමීප අධීක්ෂණයක් අවශ්‍ය දරුවන් මෙන්ම අඛණ්ඩ ව ප්‍රතිකාර අවශ්‍ය වන්නා වූ දරුවන්, අපයෝජනයන් ගේ වින්දිතයන් වූ දරුවන් හා තදබල ශාරීරික හා මානසික ආබාධ සහිත දරුවන් වැනි, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් රඳවා තැබීම සිදු කෙරේ. එමෙන් ම සුවපත් වීම සඳහා විවේක සත්කාරයන් මගින් සලසන කාලයට වඩා වැඩි කාලයක් අවශ්‍ය දරුවන් හට ද, විශාල නේවාසික රැකවරණයන් හී සිට සමාජගත කිරීම තෙක් සංක්‍රාන්ති පියවරක් වශයෙන් යොදා ගැනීමට ද කණ්ඩායම් නිවාස යොදා ගත හැකිය. සාමාන්‍යයෙන් පවුලක ස්වභාවය සහිත කුඩා නිවාසයන් හී, දරුවන් තම න්‍යෂ්ටික පවුල හෝ ඥාති හෝ කුලවැද්දූ පවුල සමග එක් කරන තෙක් රැකබලා ගන්නා සත්කාර මාපියන් සිටිති. දරුවන් රැකබලා ගන්නා සත්කාර මව්වරුන් සහිත පවුලක ස්වභාවයෙන් යුත් විසීමක් සපයන කණ්ඩායම් නිවාස කිහිපයක් ශ්‍රී ලංකාවෙහි ඇත.

**ළමා පුහුණු හා උපදේශන සේවා මධ්‍යස්ථානය** - මෙම මධ්‍යස්ථානය අපයෝජනයන් ගේ වින්දිත දරුවන්හට සහ නීතිය සමග ගැටුම් ඇති කරගත් දරුවන්හට රැකවරණය සපයනු ලබයි. එමෙන්ම මෙම මධ්‍යස්ථානය මගින් දරුවන් හට සය මස් කාලයක් තුල සමාජ හා චිත්තාවේග සහයයන් මෙන්ම වෘත්තිය පුහුණු වීම් ලබා දීම සිදු කරයි.

**පුද්ගලික නේවාසික ස්ථාන** - ශ්‍රී ලංකාවෙහි විවිධ පුද්ගලික නේවාසික ස්ථානයන් ඇති අතර, ඒවා නිවසින් දුර බැහැරව ප්‍රාථමික හෝ ද්විතියික අධ්‍යාපනය හදාරන දරුවන් සඳහා ආහාර හා නවාතැන් සපයනු ලබන්නා වූ පුද්ගලික නිවාසයන් වේ. මෙම නේවාසික ස්ථානයන් හී කාමර තනි පුද්ගල පදනමට හෝ පුද්ගලයින් කිහිප දෙනෙකුහට හෝ ලබා දෙන අතර ගාස්තු අය කිරීම මාසික ව සිදු කෙරේ. ඇතැම් හිමිකරුවන් නවාතැන් පමණක් ලබා දෙන අතර නවාතැන් ලබා ගන්නන් ආහාර සපයා ගැනීම සඳහා ක්‍රමවේදයක් යොදා ගත යුතුය.

**භාර ගැනීමේ නිවාස** - රජයේ භාර ගැනීමේ නිවාස, අලුත උපන් දරුවන් සහ වයස අවුරුදු 5 ට අඩු දරුවන්හට

නේවාසික රැකවරණ සපයන ස්ථාන වේ. මේවා අනාථ, අත්හල හා ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය දරුවන්හට රැකවරණ සලසනු ලබයි. විවිධ ප්‍රදේශයන් හී පිහිටුවා ඇති භාර ගැනීමේ නිවාස ගණනාවක් ශ්‍රී ලංකාවෙහි ඇත. ඉන් බොහොමයක දරුවන් අධික සංඛ්‍යාවක් හා අවශ්‍යතාවයට වඩා අඩු කාර්ය මණ්ඩලයක් සිටින අතර එම හේතුව කරන කොට ගෙන පවුලක වැනි රැකවරණයක් සැලසීම සිදු නොවේ. අලුත උපන් බිලිඳුන් හා ළදරුවන් හට ඔවුන් ගේ මුල් අවධියේ දී අවධානය හා රැකවරණය තනි තනි ව අවශ්‍ය වන බැවින්, භාරගැනීමේ නිවාස සමීප ඇගයීමකට ලක් කොට පවුලක වැනි පරිසර තත්ත්ව සහිත ළමා මිතුරු ස්ථාන බවට ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කෙරෙනු ඇත.

**රැඳවුම් නිවාස** - රැඳවුම් නිවාස, නිවර්තන නිවාස විශේෂයක් වන අතර, දරුවන්ට අදාල නඩු අධිකරණයෙහි විභාග කෙරෙන අතරතුර නවතා තැබීම සඳහා පිහිටුවා ඇත. මේවායෙහි රඳවා ගැනීම සිදු කෙරෙනුයේ මිනී මැරීම සඳහා සැක කිරීම, මිනී මැරීමට තැත් කිරීම, ගිනි තැබීම, අපයෝජන වින්දිතයින් හා ලිංගික හිරිහැර වලට ලක් වූ දරුවන්, සොරකම, කලහ කිරිම, අකීකරුකම, අයාලේ සැරිසැරීම, අතහැර යෑම, මත්පාන් හා මත් ද්‍රව්‍ය භාවිතය, ශ්‍රමිකත්වය, වැඩිදුර විමර්ශන සිදු කිරීම වැනි හේතුවලට අදාල දරුවන්ය. දැනට මෙම නිවාසවල පවුලක වැනි පරිසරයක් නොමැති බැවින් රැඳවුම් නිවාස ද ප්‍රතිසංස්කරණය කිරීම හා ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කෙරෙනු ඇත.

**විවේක සත්කාර** - විවේක සත්කාරයන් පවත්වාගෙන යනු ලබන්නේ ශාරීරික ආබාධයන් සහ මානසික හා වෙනත් තදබල සෞඛ්‍යමය අවශ්‍යතාවයන් වැනි සංකීර්ණ අවශ්‍යතා සහිත දරුවන් සඳහාය. ඇතැම් විවේක සත්කාරයන් දිවා කාලයෙහි ක්‍රියාත්මක වන අතර දෙමාපියන්/භාරකරුවන් සිය දරුවන් ඇරලවීම සිදු කරයි. අනෙකුත් විවේක සත්කාරයන් කෙටි කාලයක් සඳහා වන අතර දරුවන්හට වෛද්‍ය, චිත්තාවේග සහ සාමාජීය සහයයන් ලබා දෙයි. මේවායෙහි උපදේශනය, කථනය, මනෝවෛද්‍ය හා භෞතික චිකිත්සාව වැනි විවිධ ක්ෂේත්‍රයන් හී චිකිත්සක ප්‍රතිකර්ම ලබා දේ. ශ්‍රී ලංකාවෙහි විවේක සත්කාරයන් සුළු සංඛ්‍යාවක් ඇති අතර ඒ සඳහා ඇති අවශ්‍යතාවය අතිමහත්ය.

**ආරක්ෂිත නිවාස** - ආරක්ෂිත නිවාස අධිකරණ තීන්දුව ලබා දීමට ඇති දරුවන් සඳහා නවාතැනක් ද සරණක් ද වන අතර ශ්‍රී ලංකාවෙහි බොහොමයක් ආරක්ෂිත නිවාස රජය මගින් පවත්වා ගෙන ලබන ඒවා වෙයි. ඇතැම් ආරක්ෂිත නිවාස දරුවාට සහ දරුවාගේ මව යන දෙදෙනාට ම සෙවන සලසන අතර ඇතැම් මවුවරුන් තවමත් ළමයින්ය. ළමා මව්වරුන් ළමා නිවාසයකට මාරු කෙරෙන තෙක් හෝ කුලවද්දා ගැනීමක් සිදු වන තුරු ඔවුන්හට වෘත්තිය පුහුණුව සහ අධ්‍යාපනය ලබා දීම මේවායෙහි සිදු කෙරෙන අතර, දෙමාපියන් වෙනත් විවාහ සිදු කර ගැනීම, අපරාධකරු තම නිවසෙහි ම අයෙක් වීම හේතුවෙන් ආරක්ෂාව සම්බන්ධ ගැටලු, සමාජ අපකීර්තිය සහ ගැරහුම් හේතුවෙන් බොහොමයක් ළමා මව්වරුන් තමන් පදිංචි ව සිටි ප්‍රදේශයට නැවත පදිංචියට නොයයි. ආරක්ෂිත නිවාසයන් හී අවශ්‍යතාවය පිලිගනිමින් දැනට පවතින ආරක්ෂිත නිවාසයන් ද ඇගයීමට ලක් කර ප්‍රතිව්‍යුහගත කරනු ඇත.

**ස්වේච්ඡා නිවාස** - දරිද්‍රතාවය, අපයෝජනයට ලක්වීම, නොසලකා හැරීම, අනාථබව සහ පවුල් අසංගතිය වැනි විවිධ හේතු කරන කොට ගෙන නවාතැනක අවශ්‍යතාවය ඇති වයස අවුරුදු 5 ට වැඩි දරුවන්හට ස්වේච්ඡා නිවාසයන් හී ඉඩ සැලසීම සිදු කෙරේ. ශ්‍රී ලංකාවෙහි ළමා රැකවරණ ආයතනයන් ගෙන් බහුතරයක් ස්වේච්ඡා නිවාසයන් වන අතර, රාජ්‍ය නොවන පාර්ශවකරුවන් විසින් පවත්නා ගෙන යනු ලබන අතර පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මගින් අධීක්ෂණය කෙරේ. අධික තදබදය හා කාර්ය මණ්ඩලය අඩු වීම හේතුවෙන් භාර ගැනීමේ නිවාස ලෙසින් ම ශ්‍රී ලංකාවෙහි ඇති බොහොමයක් ස්වේච්ඡා නිවාසයන් ද පවුල් පරිසරය බඳු ස්වභාවයක් නොගනී. ආයතනහරණ ක්‍රියාවලියේ දී මේවා ප්‍රතිව්‍යුහගත කිරීම ද අත්‍යවශ්‍ය කර්තව්‍යයක් ව පවතී

## ඇමුණුම - 2

### නෛතික රාමුව

අවදානම් සහගත දරුවන් හා අවදානම් සහගත තත්ත්වයට පත් විය හැකි දරුවන් සඳහා බොහෝ ජාතික නෛතික ආරක්ෂණ යාන්ත්‍රණයන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි, එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිලිබඳ සම්මුතියෙහි; 1939 ළමුන් හා යෞවනයන් පිලිබඳ ආඥා පනතෙහි; 1941 අනත්දරු නිවාස ආඥා පනතෙහි; 1949 අංක 24 දරණ දරුකමට හදාවඩා ගැනීමේ ආඥා පනතෙහි; 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතෙහි; 2003 ආබාධිතභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි සහ 2005 අංක 16 දරණ සුනාමි (විශේෂ විධිවිධාන) පනතෙහි ඇතුලත් කොට ඇත. රජයෙහි ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය ළමුන්ට අදාල විධිවිධාන ඇතුලත් ළමා (අධිකරණ ආරක්ෂණ) පනත් කෙටුම්පත ද රජය විසින් කෙටුම්පත් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දරුවන් සහ පවුල් ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිගෙන ඇත. එහි iv වන පරිච්ඡේදය

වන රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ දරුවන් සඳහා විධිවිධාන රාශියක් ඇතුලත් කොට ඇත; එහි 27(12) මෙහෙයවීමේ මූලධර්මය යටතේ "පවුල, සමාජයේ මූලික ඒකකය වශයෙන් රජය විසින් පිළිගෙන ආරක්ෂා කළ යුත්තේ ය"යනුවෙන් සඳහන් කරන අතර "ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන්, සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සාමාජික වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත්, ඔවුන් ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම් වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකි වන පරිදි ඔවුන්ගේ සුභ සිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව වර්ධනය කළ යුත්තේ ය." යනුවෙන් 27(13) මෙහෙයවීමේ මූලධර්මය යටතේ සඳහන් වේ.

"ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස ද, ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනය ද,විවේකය සහ සමාජයීය හා සංස්කෘතික පූර්ණ වශයෙන් භුක්ති විඳ නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම ද ඇතුළුව ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියලු පුරවැසියන් විසින් තමන්ට සහ තම පවුල්වල සාමාජිකයන්ට අත්කර දීම" එහි 27(2) වන මෙහෙයවීමේ මූලධර්මය සඳහන් කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එහි vi වන පරිච්ඡේදයේ 27(15) වන මූලධර්ම වගන්තියෙන් අන්තර්ජාතික නීති සහ ගිවිසුම්වලට එකඟතාව ප්‍රකාශ කරමින් "ජාත්‍යන්තර සාමය, සුරක්ෂිත භාවය හා සහයෝගිතාව වර්ධනය කිරීම ද, ජාතීන් අතර කටයුතු වල දී ජාත්‍යන්තර නීතිය සහ ගිවිසගත් බැඳීම් කෙරෙහි ගෞරවය ඇති කිරීමට උත්සාහ කිරීම ද ධර්මිෂ්ඨ හා සාධාරණ ජාත්‍යන්තර ආර්ථික හා සමාජ ක්‍රමයක් ඇති කිරීමට උත්සාහ කිරීම ද රජය විසින් කළ යුත්තේ ය.'' යනුවෙන් ප්‍රකාශ කරයි. ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් සම්මුතිය අපරානුමත කර ඇත. පවුල් ඒකකයක පරිසරය ආරක්ෂා කිරීමේ වැදගත්කම සහ දරුවාට විශේෂිත රැකවරණයක් ලබා දීම සම්බන්ධයෙන් වූ බහුවිධ වගන්ති ළමා හිමිකම් සම්මුතියේ ප්‍රස්ථාවනාවේ ඇතුළත් කොට ඇත.

ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2016-2020) ළමුන් සඳහා දැනට පවත්නා රජයේ ප්‍රධාන ක්‍රමෝපායික ලේඛනය වන අතර එයට මාර්ගෝපදේශකත්වය සපයා ඇත්තේ ළමා හිමිකම් පිළිබඳ සම්මුතිය සහ 1992 ශ්‍රී ලංකා ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය මගිනි. ළමා හිංසනය නිමා කිරීමේ ගෝලීය සාමූහිකත්වය යටතේ ක්‍රියා කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ද පුරෝගාමී රටක් වන අතර මෙමගින් තිරසර සංවර්ධන ඉලක්ක අංක 16.2 සාක්ෂාත් කර ගැනීමේ රටේ අපේක්ෂාවට රුකුලක් සැපයේ. මෙම ක්‍රියාවේ අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ ජාතික හා අන්තර්ජාතික බැඳම්වලට අනුව, සියලුම දරුවන්ට හිමිකම් හා ආරක්ෂාව ලබාදීමේ ජාතික හා පළාත් ප්‍රයත්න සඳහා මාර්ගෝපදේශයන් ලබා දීමය. ළමුන්ගේ පූර්ණ සංවර්ධනය තහවුරු වන පරිදි සහ ඔවුන් සතු සුවිශේෂ හැකියාවන් හා කුසලතාවන් සංවර්ධනය කරගැනීමට ඉඩකඩ සැලසෙන පරිදි, සියලු ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් ඔවුන්ගේ වර්ධනයට හා සංවර්ධනයට සුදුසු, සුරක්ෂිත සහ ඒ සඳහා උපකාරී වන පරිසරයක් නිර්මාණය කිරීම මෙම ක්‍රියාකාරී සැලැස්මේ අරමුණයි.

නීතිය සමග සම්බන්ධ වූ දරුවන් හා නීතිය සමග ගැටුම් ඇති කරගත් දරුවන් සඳහා බොහෝ විකල්ප රැකවරණ ක්‍රම ළමා හා යෞවනයන් පිළිබඳ ආඥා පනතෙහි අන්තර්ගත කොට ඇත. එහි ළමා උසාවි පිහිටුවීම සඳහාත්, ළමා වරදකරුවන් අධීක්ෂණය කිරීම සඳහාත්, අපයෝජනයට හා සූරාකෑමට ලක් වූ ළමා හා තරුණ වින්දිතයින් ආරක්ෂා කිරීම සඳහාත් විධිවිධාන සලසා ඇත.

අංක 50 දරන ජාතික ළමා රක්ෂක අධිකාරී පනත 1998 වසරේ දී පනවන ලද අතර, එමගින් ළමා අපචාර වැලැක්වීම, අපචාරවල වින්දිතයින් හට ප්‍රතිකාර කිරීම හා අධීක්ෂණ කටයුතු සඳහා ජාතික ළමා රක්ෂක අධිකාරිය පිහිටුවන ලදි. එම පනතෙහි 14 (ඒ) වගන්තිය මගින් අපරාධ පිලිබඳ විමර්ශනයන්ට බඳුන් ව සිටින දරුවන් ගේ සහ අපරාධ නඩු කටයුතුවලට බඳුන් ව සිටින දරුවන් ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා අවශ්‍ය පියවර ගැනීමේ බලය ජාතික ළමා රක්ෂක අධිකාරියට ලබා දෙයි.

අවදානම් තත්ත්වයන් යටතේ සිටින දරුවන්ට අදාල නීති, ප්‍රතිපත්ති සහ පරිපාලන චක්‍රලේඛ ශ්‍රී ලංකාවෙහි බොහෝ ඇතත් පවතින ප්‍රතිපත්ති රාමුවල මෙන් ම ඒවා ක්‍රියාවට නැංවීමේ ද අඩුපාඩු පවතී. දෙමාපිය රැකවරණයෙන් බැහැර ව විකල්ප රැකවරණයන් හී සිටින දරුවන් ගේ රැකවරණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් බොහොමයක් මට්ටම්වල දී විශේෂයෙන් ම නීති වල සංශෝධනයන් සිදු කිරීම අවශ්‍ය වේ. ළමා ආරක්ෂාව පිලිබඳ විෂය, විකල්ප රැකවරණය හා බොහෝ සෙයින් අතිපිහිත වේ. දරුවන් සමග කටයුතු කිරීම සැලකීමේ දී, ශ්‍රී ලංකාවෙහි අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තු ගණනාවක් ඇති අතර ඉන් බොහොමයක කාර්යභාරයන් අතිපිහිත වේ. ළමා ආරක්ෂාව හා රැකවරණය සඳහා ශ්‍රී ලංකාව වර්තමානයේ බහු ආංශික ප්‍රවේශයක් අනුගමනය කරන නමුත් දෙපාර්තමේන්තු අතර ඇති සහයෝගීත්වය තවදුරටත් ඉහළ නැංවීම ඉතා අවශ්‍ය වේ. දරුවන් සඳහා විකල්ප රැකවරණ සැලසීම පිලිබඳ වූ මෙම ප්‍රතිපත්තිය මගින් මෙම විවිධ වූ කාර්යභාරයන් සැලකිල්ලට

ලක්කරමින් පරිපූර්ණ ප්‍රතිපත්ති විධිවිධානයන් ඉදිරිපත් කර ඇත.

එමෙන්ම අප රටෙහි විකල්ප රැකවරණ ක්‍රමවේදය පැවරුණු විෂයක් වන අතර එයට අදාල කටයුතු සම්බන්ධයෙන් වැඩි කාර්යභාරයක් ඉටුකරනු ලබන්නේ පළාත් රජයයන් හා ඒවායෙහි අදාල ආයතනයන් මගිනි. ළමා ආරක්ෂාව හා රැකවරණයට අදාල ව ඔවුන් තමන්ගේම වැඩසටහන් සකස් කර ක්‍රියාවට නැංවීම සිදු කරනු ලබයි. එබැවින් දරුවන් වාසය කරන ස්ථානය කොතැනක වුවත්, දරුවන් ගේ උපරිම යහපත ආරක්ෂා වන බව තහවුරු කරනු පිණිස, රටපුරා අවම තත්ත්ව සහතික කර ක්‍රියාවට නැංවීම සඳහා සඳහා ජාතික රාමුවක් තිබීම මෙන්ම මගපෙන්වීමක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය එම ඉලක්කය සපුරා ගැනීම මෙන් ම ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ සියලු ක්‍රියාකාරීන්ට සහය වීම අරමුණු කර ගනී.

## ඇමුණුම - 3

**දරුවකුගේ සමාජ ආර්ථික හා ආරක්ෂක අයිතීන් කඩවීමේ න්‍යාසය - දෙමාපියන්/භාරකරුවන් වගකීම දරන්නන් ලෙස සැලකීමේ දී**

| **තත්ත්වය අවස්ථාව** | **දෙමාපියන් ගේ අඩු ආදායම් තත්ත්වය; වෙනත් ප්‍රදේශයකට සංක්‍රමණය වීම; අධීක්ෂණයක් නොමැතිව දරුවන්/ නව යෞවනයන් තබායාම; හුදෙකලා ප්‍රදේශවල වාසය කිරීම; පාළු ප්‍රදේශ ඔස්සේ වැඩි දුරක් පාසැලට ඇවිද යාම; ආයාසකර ගේදොර වැඩ මධ්‍යයේ ජීවත්වීම** | **දෙමාපියන් ගේ තත්ත්වය: විවාහක, මිය යාම, අතහැර යාම, වෙන්වීම හේතුවෙන් තනි වූ/ දික්කසාද වී, විදේශගත වී, සිරගත වී සිටින, සහකරු සමග වීදියේ ජීවත්වන** | **පවුලේ සාමාජිකයකු ගේ මානසික/ශාරීරික ආබාධිතබව/ ඒඩ්ස් රෝගයෙන් පෙළීම, දරුවා ගේ විශේෂ අවශ්‍යතා** | **වයස අවුරුදු 5 වන තෙක් දරුවා බන්ධනාගාරගත වූ/ රැඳවුම්භාරයේ තැබූ මව සමග විසීම** |
|---|---|---|---|---|
| දරුවා ගේ අධ්‍යාපනික කාර්යසාධනය | ශ්‍රේණියට සරිලන අයුරින් සම්පත් ප්‍රමාණවත්ව නොමැති වීම, චිත්තවේග අස්ථාවරත්වය | පැසැල් හැරයාම, මූලික අධ්‍යාපනික සුදුසුකම් සපුරා නොගැනීම, අඩු වයස් ගැබ් ගැනීම් | දරුවාහට රෝගියා රැකබලා ගැනීම සඳහා සුදුසු සහයක ක්‍රමවේද සහ පවුලට ආදායම් සැපයීම් නොමැති වීම | සුදුසු සහ ප්‍රමාණවත් පූර්ව ළමාවිය රැකවරණ සහ සංවර්ධන පහසුකම් නොලැබීම |
| පවුල් හිංසනයට නිරාවරණය වී ජීවත්වන දරුවන්, මුදලට දී ඇති දරුවන් | වානිජ ලිංගික සූරා කෑමෙහි වින්දිත දරුවන්/නව යෞවනයන්, බියෙන් හා ආතතියෙන් ජීවත්වීම; දරුවා අපරාධකරුවා අනුකරණය කිරීම | සියලු ආකාරයේ ළමා අපයෝජනයන්ට ලක්වීම; රස්තියාදුවේ යාම; පැනයාම; දෙමාපියන්, ගුරුවරුන්, සමවයස් කණ්ඩායම්, 'සහකරුවන්' සමග ගැටුම් | රෝගියා විසින් දරුවා හිංසනයට/ අපයෝජනයට/ මරණයට ලක්වීම | මවට සහ අනෙක් රැඳවියන්ට පමුණුවන හිංසනයන් දරුවාට දශර්නය වීම, අපයෝජනයට ලක්වීමේ අවදානම |
| දෙමාපියන්/භාරකරුවන් විසින් දරුවන් නොසලකා හැරීම | අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් පෝෂණය ලැබීම,මානසික/සනීපාරක්ෂක ගැටළු; හදිසි අනතුරුවලට නැඹුරුතාවක්‍ෂමත්ද්‍රව්‍ය/දුම්වැටි භාවිතය | දරුවන් හානිකර හා අතිශය නුසුදුසු රැකියාවන්හි යෙදවීමට ලක්විම - තමාට/ පවුලට සහය වීම සඳහා | පූර්ව ළමාවිය රැකවරණය සහ සංවර්ධනය අහිමි වීම | දරුවාගේ නිදහස අහිමිවීම, |
| අධික තදබදය සහිත ජීවන තත්ත්වයන් | ජීවත්වීම සඳහා භෞතික ඉඩකඩ අඩුවීම; අනාරක්ෂිත සනීපාරක්ෂක පහසුකම්; පෞද්ගලිකත්වය නොමැතිවීම | වැඩිහිටියන් ගේ හැසිරීම් නිරීක්ෂනය කිරීමට හා අත්හදා බැලීමට නැඹුරුවීම; වැඩිහිටියන් ගේ හැසිරීම් වලින් සමවයස් කණ්ඩායම් බිය වැද්දීම | බලපෑමට ලක්වී සිටින වැඩිහිටියා/ දරුවාහට පෞද්ගලිකත්වයක් නොමැති වීම, ඔහුගේ/ඇයගේ ගෞරවයට හානිසිදු වීම | වැඩිහිටි හැසිරීම් නිරීක්ෂණය කිරීමට පුරුදුවීම, වැඩිහිටි වාදවිවාදයන්ට කන් දීම, පුද්ගලිකත්වයක් නොමැති වීම |
| සමාජ අපකීතරීයට ලක් වූ දරුවා | දෙමාපියන් ගේ සමාජ පසුබිම, ජන වගර්ය, කුලය, ජීවනෝපාය; විදිගතව ජීවත්වීම, ගෝත්‍රික/ අභිකුණ්ඨක | දෙමාපියන් හෝ දරුවා නීතිය කඩ කරමින් සිටීම / කඩකර තිබීම | දෙමාපියන්ගේ හෝ සහෝදරයාගේ තත්ත්වය හේතු කොට ගෙන දරුවා සමාජයෙන් පිටමං කිරීම | බන්ධනාගාරයෙහි සිටීම/ සිර ගෙදර දී ඉපදීම හේතුකොට සමාජයෙන් කොන් වීම |

**දරුවකුගේ සමාජ ආර්ථික හා ආරක්ෂක අයිතීන් කඩවීම් - රජය වගකීම දරන්නා ලෙස සැලකීමේ**

| තත්ත්වය<br>අවස්ථාව | ආයතනයේ මූල්‍ය තත්ත්වය | කායර් මණ්ඩල නිපුණතාවය; රැකවරණ මට්ටම, පරිපාලනය; කායර් මණ්ඩලය හා දරුවන් සංඛ්‍යාව අතර අනුපාතය | ආයතනයේ භෞතික පහසුකම්වල ප්‍රමිතිය: උපකරණ, සැපයුම් | ආයතනයෙන් පිටතට පැමිණීමට සැරසෙන දරුවා පිළි ගැනීමට දෙමාපියන් ගේ සූදානම්වීම |
|---|---|---|---|---|
| දරුවා ගේ අධ්‍යාපනික කාර්යය සාධනය | දරුවා ගේ අධ්‍යාපන කාර්යය සාධනයට ධනාත්මක ව බලපෑම් කිරීම පිනිස අධ්‍යාපනය නගා සිටුවීමේ සම්පත් ප්‍රමාණවත් ව නොමැති වීම | හැසිරීම පිළිබඳ ගැටලු/ අනෙක් දරුවන් ගේ සහ වැඩිහිටියන් ගේ සමාජයීය/ මානසිකමය සෞඛ්‍යට නිරාවරණය වීම, දෙමාපියන්/ භාරකරුවන් දරුවන් බැලීමට පැමිණීම පිළිබඳ ප්‍රතිපත්ති දරුවාට පැහැදිලි කර නොදීම | දරුවාහට ප්‍රමාණවත් සහ ආරක්ෂිත විදුලිය, ජල පහසුකම් නොමැති වීම | හැකියාවන් නොමැති/ සුදුසුකම් රහිත දරුවා/ යෞවනයා; බලවත් පෞරුෂයක් නොමැති, රැකවරණයෙන් පිටත දී ස්වාධීනව ජීවත් වීමට සූදානමක් නොමැති |
| ආයතනික හිංසනයට නිරාවරණය වී ජීවත්වන දරුවන් | බියෙන් හා ආතතියෙන් ජීවත්වන දරුවන්/නව යෞවනයන්; දරුවා අපරාධකරුවා අනුකරණය කිරීම | සේවක මණ්ඩලයේ අපයෝජනයට/දූෂිත ක්‍රියාවන්ට, සූරා කෑමට නිරාවරණය වීම. ළමුන් ළමුන් අතර අපයෝජන ඇති වීම, ආයතනය තුල යොවුන් කණ්ඩායම් විසින් බිය වැද්දීම් සිදුකිරීම | සොරා කෑමට ලක්වීම, අන් අය ගේ හැසිරීම් අනුකරණය කිරීම | දරුවා ආයතනගත කිරීමට තුඩු දුන් පෙර දැක්වූ හැසිරීම් දෙමාපියන්/භාරකරුවන් දිගටම පෙන්වීම |
| (ආයතනික කාර්යය මණ්ඩලය හා මණ්ඩල සාමාජිකයින් විසින්) නොසලකා හරින ලද දරුවන් | අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් පෝෂණය ලැබීම, චර්ම රෝග, පුද්ගල සනීපාරක්ෂාව පිළිබඳ ගැටලු, වර්ධන ගැටලු | ළමා /යොවුන් අනතුරු/මරණ/දූෂණය කිරීම්, දරුවා හා පවුල පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු නොමැති වීම, අවශ්‍ය මනෝවෛද්‍යමය සත්කාරයන් මග හැරීම | ආයතනයේ පහසුකම් නඩත්තුව අතපසු කිරීම; සෞඛ්‍යමය උවදුරු, අනතුරුවලට, පැන යාමට නැඹුරුවීම | දරුවා පිලිගැනීමට දෙමාපියන් සූදානම් නොමැතිවීම; පවුලේ තත්ත්වය දරුවා ආයතනගත කිරීමට පෙර පැවති වීම |
| අධික තදබදය සහිත ව දරුවන් ජීවත්වීම | ප්‍රමාණවත් ඉඩකඩ සපයාදීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් ව නොමැතිවීම | ළමුන් හා පහසුකම් කළමනාකරණය කිරීමට කාර්යය මණ්ඩලයට නොහැකි වීම | ධාරිතාවය ඉක්මවා යෑම, දරුවාහට පෞද්ගලිකත්වය අඩු වීම, බඩුබාහිරාදිය (එකිනෙකාගේ) නැතිවීම, අධික ශබ්දය | ආයතනයන්හි දරුවන්හට හැසිරීම උගන්වනු ලබන්නක් වන බැවින් පවුල් ජීවිතයකට හැඩගැසීම ගැටළුකාරී වීම |
| සමාජ අපකීර්තියට ලක් වූ දරුවා | උචිත ඇඳුම් පැලඳුම්/ ප්‍රමාණවත් ඇඳ ඇතිරිලි, කොට්ට මෙට්ට නොමැති වීම | කාර්යය මණ්ඩලයේ අහිතකර සැලකිලි, විවිධ නම්-ගම් දැමීම, නිල ඇඳුමින් සැරසුන පුද්ගලයින් කැටුව යන විට මහජන සමච්ඡලයට ලක්වීම | දරුවා ආන පිරිනැමීම් , පිනට දීම් සඳහා අවශ්‍යතාවය සහිත දරුවකු වශයෙන් නිරාවරණය වීම | ආයතනගත වීම හේතුවෙන් තමා විසින් ම සමාජයෙන් වෙන් වී සිටීම හෝ අන් අය විසින් වෙන් කිරීම |

**කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය**

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**


බී කොටස, 03 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
“பீ” பிரிவு, 03ம் மாடி, ஐஜம் தொகுதி, செத்சிரிபாய, பத்தரமுல்லை, இலங்கை.
Wing B, 03rd Floor, Sethsiripaya Stage II, Battaramulla, Sri Lanka.
වෙබ්/ இணையம் / Web: www.probation.gov.lk


Printed by: Nelum Printers - 0773179599